
ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

இலங்கை ஊக்கமருந்து தடுப்பு முகவர் நிறுவனம்

Sri Lanka Anti-Doping Agency

SLADA

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | விளையாட்டுத்துறை மற்றும் இளைஞர் விவகார அமைச்சு | Ministry of Sports and Youth Affairs



2023

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

#cleansport

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

වාර්ෂික වාර්තාව 2023

සිංහල

පටුන

1. ආයතනික තොරතුරු
2. දැක්ම, මෙහෙවර සහ අරමුණු
3. වැදගත් සංධිස්ථාන
4. ප්‍රධාන කාර්ය සාධන සාරාංශය
5. සභාපතිතුමාගේ පණිවුඩය
6. අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය
7. අධ්‍යක්ෂ මණ්ඩලය - 2023
8. අධ්‍යක්ෂ මණ්ඩායේ වාර්තාව
9. ආයතන ව්‍යූහය සහ කාර්ය මණ්ඩල තොරතුරු
10. මෙහෙයුම් ප්‍රගතිය
    - අධ්‍යාපන හා පරීක්ෂණ අංශය
    - නීති අංශය
    - බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම් අංශය
    - පර්යේෂණ අංශය
11. 18වැනි ආසියානු ශාන්තිකර කලාපීය අන්තර් රාජ්‍ය අමාත්‍ය මණ්ඩල සමුළුව
12. තිරසාරභාවය පිළිබඳ වාර්තාව
13. ආයතනික පාලන ය
14. අවදානම් කළමනාකරණ වාර්තාව
15. විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව
16. මූල්‍ය වාර්තා
17. ස්වාධීන විගණනකරුවන්ගේ වාර්තාව
18. කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

වර්තමානයේ ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා ක්ෂේත්‍රය ශීඝ්‍රයෙන් වාණිජකරණය වී තිබේ. ඒ හේතුවෙන් වර්තමාන ක්‍රීඩක ක්‍රීඩකාවන් හුදෙක් ම ජයග්‍රහණය අරමුණු කොටගෙන ක්‍රීඩා කිරීමට යොමු වී තිබේ. මෙහිදී පවතින දැඩි තරගකාරීත්වය නිසා ම නීත්‍යානුකූල නොවන ක්‍රමවේද භාවිතා කර හුදු ජයග්‍රහණ ලබා ගැනීමට ඔවුන් පෙළඹී තිබේ.

මේ හේතුවෙන් ක්‍රීඩාවේ දී තහනම් ද්‍රව්‍ය හා ක්‍රම කරලියට පැමිණ තිබේ. ජාතික මෙන් ම ජාත්‍යන්තර ක්‍රීඩා තරගවල දී මෙම තහනම් ද්‍රව්‍ය භාවිතය තුළින් ක්‍රීඩාවේ අව්‍යාජ භාවයට හානි සිදුකරනවා සේ ම අවසානයේ රටක් ලෙස ජාත්‍යන්තරය ඉදිරියේ අපකීර්තියට පත් ව රටේ ජවසම්පන්න මතු පරපුර සෞඛ්‍ය අතින් පරිහානියට ද පත් වේ.

ජාත්‍යන්තර මට්ටමෙන් තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සඳහා 1999ට කැනඩාවේ මොන්ට්‍රියෙල් නුවර කේන්ද්‍ර කොටගෙන ක්‍රියාත්මක වන ලෝක තහනම් උත්තේජක මර්දන ආයතනය අනුගමනය කරමින් 2013 වසර තෙක් ම ශ්‍රී ලාංකික ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සහ ඒ පිළිබඳව නිරූපණය කිරීම් සිදු කිරීම ක්‍රීඩා වෛද්‍ය ආයතනය මගින් සිදුවිය.

මෙම විෂය ඉටුකිරීම සඳහා ස්වාධීන ව කටයුතු කරන වෙනම ම ආයතනයක අවශ්‍යතාවය ඒ වන විටත් මතුවෙමින් තිබූ බැවින් 2013 වර්ෂයේ නොවැම්බර් 18 වැනි දින දී “2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත” සංස්ථාපනය කෙරුණි. එම පනතේ තුන්වන කොටස යටතේ තහනම් ද්‍රව්‍ය හා ක්‍රම ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවේ මුලිනුපුටා දැමීම වන විෂය තේමා කර ගත් ශ්‍රී ලාංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය නමින් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් බිහි කරනු ලැබීය.

දැනට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස කටයුතු කරයි.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ ප්‍රමුඛ පරමාර්ථය වනුයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ක්‍රීඩාවේ දී භාවිතා නොකළ යුතු තහනම් උත්තේජක මුලිනුපුටා දැමීම හා යහපත් පිරිසිදු භාවයෙන් යුතු ක්‍රීඩාවක් ප්‍රවර්ධනය කිරීම යි.

ආයතනික තොරතුරු

▶ ආයතනයේ නම

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

▶ නෛතික ස්වරූපය

2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ තුන්වන කොටස යටතේ මෙම ආයතනය පිහිටුවා ඇත.

▶ ආරම්භක දිනය

2013 වර්ෂයේ නොවැම්බර් 10 වැනි දින

▶ කාර්යාලයේ ලියාපදිංචි ලිපිනය

363/12, සුගතදාස ස්ටේඩියම්-බ්ලොක් ඩී, ක්‍රීඩා සංකීර්ණ රථගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14.

▶ දූරකථන අංක

0113 071 838

0112 328 366

▶ විද්‍යුත් තැපෑල

sladasl@yahoo.com

▶ වෙබ් අඩවිය

www.antidopingsrilanka.org

▶ බදු හඳුනා ගැනීමේ අංකය

409386822

▶ විගණක

විගණකාධිපති

▶ බැංකුකරුවන්

ලංකා බැංකුව


දැක්ම

නිවැරදි හා සාධාරණ ජයග්‍රහණයක් උදෙසා තහනම් ද්‍රව්‍යවලින් තොර

ශ්‍රී ලාංකීය ක්‍රීඩා ජවයක්

මෙහෙවර

ලෝක මත්ද්‍රව්‍ය නිවාරණ පනත සහ එහි රෙගුලාසිවලට අනුකූල වන ආකාරයට **2013** අංක **33** දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත ක්‍රියාත්මක කිරීම



අරමුණු

මූලික අරමුණ

ශ්‍රී ලංකාවේ ජාතික තහනම් උත්තේජක මර්දන ප්‍රතිපත්තියට අනුකූල ව කටයුතු කිරීමට සහය දැක්වීම.

ද්විතීයික අරමුණු

- ජාතික තහනම් උත්තේජක මර්දන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් රජයට, ක්‍රීඩා අමාත්‍යාංශය සහ ජාතික ඔලිම්පික් කමිටුව දැනුවත් කිරීම.
- 2021 ලෝක තහනම් උත්තේජක මර්දන නීති සංග්‍රහය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් ශ්‍රී ලංකාව පුරා ක්‍රියාවට නැංවීම ප්‍රමුඛ වීම.
- ජාතික තහනම් උත්තේජක මර්දන ප්‍රතිපත්තියට අනුකූල වීම සඳහා සියලුම ක්‍රීඩා සමාගම්/ ආයතනවලට සහයෝගය ලබා දීම.
- වාණිජමය පදනමින් අදාළ වන ලෝක තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි කලාපීය තහනම් උත්තේජක මර්දන ආයතන ඇතුළු ව අනෙකුත් තහනම් උත්තේජක මර්දන ආයතන සමග යාවත්කාලීන වූ තහනම් උත්තේජක මර්දන භාවිතයන් සහ විශේෂඥ දැනුම බෙදා ගැනීම.
- WADA සහ NADOs ඇතුළු බලගතු උත්තේජක මර්දන ආයතන සමඟ. සහයෝගයෙන් කටයුතු කිරීම.
- ජාතික වැදගත්කමක් ඇති ඉහළ මට්ටමේ ක්‍රීඩා ඉසව් සඳහා විශේෂඥ තහනම් උත්තේජක මර්දනය සම්බන්ධ උපදෙස් සහ මගපෙන්වීම ලබා දීම.
- සියලු ම ප්‍රධාන ඉසව් සම්බන්ධ වගකීම් ලෝක මට්ටමේ ප්‍රමිතියට අනුව ඉටු කිරීම.
- තහනම් උත්තේජක භාවිතය වැළැක්වීම සඳහා අවදානම් මත පදනම් වූ ඒකාබද්ධ වැඩසටහනක් ලබා දීම.
- අභ්‍යන්තර හා බාහිර ව විශේෂඥයන් යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවේ දී තහනම් උත්තේජක භාවිතයේ අවදානම අඛණ්ඩව ඇගයීමට ලක් කිරීම.
- නීතිය බලාත්මක කිරීම ඇතුළු ව පවතින කදවුරු තුළින් බුද්ධි තොරතුරු රැස් කිරීම පිළිබඳ නිපුණතා වැඩි කිරීම.
- ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සහ අධ්‍යාපනික දර්ශනය හරහා අධ්‍යාපන වැඩසටහන් හරහා වැළැක්වීම මත පදනම් වූ සාරධර්ම ශක්තිමත් කිරීම, ඉතා සුදුසු ප්‍රායෝගික මෙවලම් සහ උපකාරක සේවා වර්ධනය මගින් සහාය වීම.
- බුද්ධි තොරතුරු ප්‍රමුඛ, ජවසම්පන්න සහ ප්‍රතිග්‍රාහක පරීක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- තහනම් උත්තේජක මර්දන නීති උල්ලංඝනය කිරීම දැඩි ලෙස විමර්ශනය කර නඩු පැවරීම.
- ජාත්‍යන්තර ප්‍රතිපත්ති සහ භාවිතයන් යොදා ගනිමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ඒකාකාර ක්‍රීඩා පිටියක් ප්‍රවර්ධනය කිරීම.

SLADA Key Milestones

2013

- **Established under the Act**

PARLIAMENT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

CONVENTION AGAINST DOPING IN SPORT ACT, No. 33 OF 2013

2018

- **Hosted the 15th Asia/Oceania Intergovernmental Ministerial Meeting in Colombo**



2019

- **Opened SLADA Headquarters Building in Colombo**



2021

- **Opened the New Research Laboratory at SLADA**



2023

- **Hosted the 18th Asia/Oceania Intergovernmental Ministerial Meeting in Colombo**



ප්‍රධාන කාර්ය සාධන සාරාංශය

විස්තරය	ගණන	2019	2020	2021	2022	2023
තහනම් උත්තේජක පරීක්ෂණ සිදු කිරීම	ගණන	260	106	177	138	130
උත්තේජක ලබාගැනීම් තහවුරු වීම්	ගණන	06	02	04	05	04
විනය පරීක්ෂණ පැවැත්වීම	ගණන	06	08	02	09	04
අභියාචනා පරීක්ෂණ පැවැත්වීම	ගණන	03	-	04	07	01
ක්‍රීඩකයන් හා ඊට අදාළ පුද්ගලයින් දැනුවත් කිරීම	වැඩසටහන්	46	28	35	48	45
දැනුවත් කිරීමේ වැඩසටහන්වලට සහභාගී වූ පුද්ගලයින්	පුද්ගලයින්	3357	965	1600	2316	2435
පර්යේෂණ Abstract වාර්තා ප්‍රකාශනය	ගණන	-	01	-	02	-
මුළු පර්යේෂණ වාර්තා ප්‍රකාශනය	ගණන	-	-	02	01	-
මෘදුකාංග සංවර්ධනය (ජංගම සහ වෙබ්)	පුද්ගලයින්	01	01	-	-	-
මුළු කාර්ය මණ්ඩලය	පුද්ගලයින්	23/27	22/28	23/29	19/29	17/29
වැටුප් සහ වේතන	රු.මි.	13.4	13.4	15.5	16.7	15.9
ආදායම	රු.මි.	0.72	2.93	1.85	2.32	5.13
දේපළ පිරියත උපකරණ	රු.මි.	273	286	270	260	228
ජංගම වත්කම්	රු.මි.	4.9	4.6	7.4	5.3	4.9
ජංගම වගකීම්	රු.මි.	8.2	15.3	16.0	12.63	5.7

සභාපතිතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ වාර්ෂික වාර්තාව 2023 සඳහා සභාපතිවරයාගේ පණිවිඩය ඉදිරිපත් කරමින් මෙම වසර තුළ ශ්‍රී ලංකාවේ පිරිසිදු හා සාධාරණ ක්‍රීඩා සංස්කෘතිය නගාසිටුවීමෙහිලා සැලකිය යුතු සන්ධිස්ථාන, සහයෝගී ප්‍රයත්නයන් සහ නොපසුබට කැපවීමක් සනිටුහන් කිරීම පිළිබඳව මාගේ සුබ පැතුම් පිරිනමමි.

2023 වසරේ 18 වැනි අන්තර් රාජ්‍ය අමාත්‍ය මණ්ඩල රැස්වීම සාර්ථක ලෙස පැවැත්වීම, ක්‍රීඩාවේ අඛණ්ඩතාව ප්‍රවර්ධනය කිරීම සඳහා වූ අපගේ ගමන් මගෙහි වැදගත් සන්ධිස්ථානයක් විය. එම රැස්වීම තුළින් ක්‍රීඩාවේ දී තහනම් උත්තේජක භාවිතයට එරෙහි සාමූහික ප්‍රයත්නයෙහි පොදු අභිමතාර්ථ වෙනුවෙන් ප්‍රධාන පාර්ශවකරුවන්, රාජ්‍ය නියෝජිතයින් සහ උත්තේජක මර්දන ආයතන ඒකරාශී කරන ලදී. 18වැනි අන්තර් රාජ්‍ය අමාත්‍ය මණ්ඩල රැස්වීම මගින් තහනම් උත්තේජක සන්දර්භයේ විවෘත සංවාදය, දැනුම බෙදාගැනීම සහ උපායමාර්ගික සැලසුම් සඳහා වේදිකාවක් සකස් විය. එහිදී පාර්ශවකරුවන් දිනෙන් දින විකාශනයවන අභියෝගවලට මුහුණදීම පිළිබඳව සාකච්ඡාවල නිරත විය. මෙම රැස්වීමේ ප්‍රතිඵල මගින් උත්තේජක භාවිතය ආශ්‍රිත ගැටලු පිළිබඳ පාර්ශවකරුවන්ගේ අවබෝධය වැඩි දියුණු කරන ලද අතර අනාගතයේදී වඩාත් ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම සඳහා මග පාදන ලදී.

2023 වර්ෂයේ දී අපගේ ජයග්‍රහණ පිළිබඳ අවධානය යොමු කරන විට, අධ්‍යාපන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී අපගේ කණ්ඩායම දරන වෙහෙස විශේෂිත ව දැක්විය යුතු ය. පිරිසිදු තරගකාරී ක්‍රීඩා සංස්කෘතියක් වර්ධනය කිරීම සඳහා අපගේ කැපවීම රට පුරා පවත්වනු ලබන වැඩමුළු, සම්මන්ත්‍රණ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් නිදර්ශනය කරන ලදී. තහනම් උත්තේජක භාවිතයේ ප්‍රතිවිපාක පිළිබඳ දැනුමෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සවිබල ගැන්වීම, සදාචාරාත්මක තීරණ ගැනීම ප්‍රවර්ධනය කිරීම සහ පිරිසිදු ක්‍රීඩාශීලිත්වයේ සංකල්ප කෙරෙහි ගැඹුරු වගකීමක් ඇති කිරීම මෙම වැඩසටහන්වල අරමුණ යි.

ඉදිරියේ දී ද, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, නම්‍යශීලීව සහ අධිෂ්ඨානශීලී ව, උත්තේජක මර්දන සංදර්භයේ විකාශනය වන අභියෝගවලට මුහුණ දීම සඳහා සූදානමින් සිටී. අපගේ කණ්ඩායමේ කැපවීම සහ සමස්ත උත්තේජක විරෝධී ප්‍රජාවගේ සහයෝගීතාවය තුළින් අවංකභාවයේ සහ විශිෂ්ටත්වයේ වටිනාකම් ආරක්ෂා කරන ක්‍රීඩා සංස්කෘතියක් ගොඩනැගීමේ මෙහෙවරෙහි අපව ඉදිරියට ගෙන යයි.

අවසාන වශයෙන්, අපගේ අනුග්‍රාහකයින්, රාජ්‍ය ආයතන, ක්‍රීඩා සම්මේලන සහ සමස්ත උත්තේජක මර්දන ප්‍රජාවට ඔවුන්ගේ නොමද සහයෝගය පිළිබඳ මගේ හදපිරි කෘතඥතාව පුද කරමි. අපගේ එකමුතුව තුළ සැලකිය යුතු ප්‍රගතියක් දැනටමත් ළඟාකරගෙන ඇති අතර, ඒ ඔස්සේ, ශ්‍රී ලංකාවේ ක්‍රීඩාව වඩාත් පිරිසිදු, සාධාරණ සහ සදාචාරාත්මක අනාගතයක් වෙත ගෙනයාමට ඇරයුම්කර සිටිමු.

මහාචාර්ය අර්ජුන ද සිල්වා
සභාපති
ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය



ක්‍රීඩාවේ දී භාවිත කරන තහනම් ද්‍රව්‍ය සහ තහනම් ක්‍රමවේද මුලිනුපුටා දමා පිරිසිදු ක්‍රීඩා පරිසරයක් ගොඩනැංවීමේ උදාරතර චේතනාව පදනම් කරගනිමින් 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත ප්‍රකාර ව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය පිහිටුවා ඇත. වසර දහයක කාලයක් පුරා තම සේවය ක්‍රීඩා උන්නතිය වෙනුවෙන් ලබා දෙමින් 2023 වර්ෂයේ දී සිය අභිමානවත් 10 වර්ෂයට පා තැබීය.

ක්‍රීඩාවේ දී භාවිත කරන තහනම් උත්තේජක පිළිබඳ 18වන ආසියා හා ශාන්තිකර කලාපීය ක්‍රීඩා අමාත්‍යවරුන්ගේ සමුළුව 2023 ජූනි 12 සහ 13 වන දිනයන්හි දී කොළඹ සිනමන් ලේක්සයිඩ් හෝටල් පරිශ්‍රයේ දී සාර්ථක අයුරින් පැවැත්විණි. ලෝක උත්තේජක මර්දන ආයතනයේ මාර්ගෝපදේශනය යටතේ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මේ සඳහා සත්කාරකත්වය ලබා දීමට හැකි වීම අප ලද භාග්‍යයකි. රටවල් 39ක පමණ නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන්, ආසියා හා ශාන්තිකර කලාපීය අමාත්‍යවරු නවදෙනෙකුගේ සහභාගීත්වයෙන් නිමාවට පත් වූ දෙදින සමුළුවෙන් වර්තමානයේ කලාපයන් තහනම් උත්තේජක විෂයේ මුහුණ දෙන අභියෝග, නීති සංග්‍රහයන් යටතේ රාජ්‍යයන්හි කාර්යභාරය සහ තම වගකීම් පිළිබඳවත් සාකච්ඡාවට බඳුන් විය. එසේ ම 2023 වසරෙන් ඔබ්බට ලෝක උත්තේජක මර්දන ආයතනයේ උපාය මාර්ගික සැලසුම් මේ තුළින් ඉදිරිපත් කිරීම ද වැදගත් විය.

ශ්‍රී ලංකා උත්තතේජක මර්දන නියෝජ්‍යායතනයේ කාර්යන් අතර ප්‍රමුඛතාවය තහනම් උත්තේජක භාවිතය වැළැක්වීම පිණිස සිදු කරනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් වෙත ලබා දී ඇත. ඒ අනුව ක්‍රීඩක, ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන් සහ ක්‍රීඩකයන් සමඟ එක් ව කටයුතු කරන සහායක පිරිස් 2435දෙනෙකු සඳහා වැඩසටහන් 45ක් 2023 වර්ෂයේ දී පැවැත්වීමට අපට හැකි විය. එසේ ම තහනම් උත්තේජක සම්බන්ධ නීති රීති උල්ලංඝණය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සොයා බැලීමට අහඹු සහ ඉලක්ක ගත තහනම් උත්තේජක පරීක්ෂණ සිදු කිරීම ද 2023 වර්ෂය පුරා සිදු කෙරිණි. එහිදී ක්‍රීඩාව තුළ දී පරීක්ෂණ (In Competition) 102ක් සහ ක්‍රීඩාවෙන් පිටත දී (Out of Competition) පරීක්ෂණ 28ක් ද සිදු කරන ලදි.

ආයතනය පිහිටුවා වසර 10ක් පමණ ගත වුව ද ක්‍රීඩකයන් සඳහා තහනම් උත්තේජක අලෙවි කරන්නන් සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමක් සිදු වී නොතිබුණ කාලයක වලාන දූෂණ මර්දන ප්‍රහාරක ඒකකය, ඖෂධ නියාමන අධිකාරිය සහ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය එක් ව සිදු කරන ලද විශේෂ වැටලීමක දී කෝටි 4කට ආසන්න වටිනාකමකින් යුත් තහනම් උත්තේජක ප්‍රමාණයක් අත්අඩංගුවට ගැනීමට හැකි විය. එය මෙතෙක් තහනම් උත්තේජක ඉතිහාසයේ සිදු කරන ලද ප්‍රථම වැටලීම බවට පත් වන්නේ ය. එපමණක් නොව නීති බලාත්මක කිරීම සම්බන්ධව කටයුතු කරන පොලිස් නිලධාරීන් තහනම් උත්තේජක විෂය පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහන් 08ක් තුළ නිලධාරීන් 924ක් දැනුවත් කිරීමට ද අපට හැකි විය.

පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් දැනුවත් කිරීම සඳහා එළිමහන් දැනුවත් කිරීමේ කුට්ටි 05ක් තුළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 1509 දෙනෙක් දැනුවත් කිරීමට ද අපට අවකාශය සැලසුණි.

කැලණිය විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය තහනම් උත්තේජක විෂය සමගාමී සමාජ විද්‍යාත්මක පර්යේෂණ පැවැත්වීමේ අරමුණින් අවබෝධාත්මක ගිවිසුමක් අත්සන් කර එය බලාත්මක කිරීමත් අප ලද තවත් ජයග්‍රහණයකි.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතන ගමන් මඟේ වර්ෂ 10ක් සම්පූර්ණ වීම හා සමගාමී ව "ජයග්‍රහණයට සීමා නොවන - අදහස්වලට වේදිකාවක්" මැයෙන් විශේෂ විද්වත් කතිකාවතක් සිදු කරන ලදි. එහිදී නිවැරදි පෝෂණය, ක්‍රීඩා අබාධවලින් වැළකීම සහ ක්‍රීඩා ආකල්ප සංවර්ධනය තුළින් පිරිසිදු ක්‍රීඩා පරිසරයක් බිහි කිරීම පිළිබඳ ව සාකච්ඡා කෙරිණි.

2023 වර්ෂය දෙස ආපසු හැරී බලන විට ඇතිවන්නේ හෘදයාංගම සතුටකි. වර්තමානයේ මෙන් ම අනාගතයේ දීත් ශ්‍රී ලංකාවේ පිරිසිදු ක්‍රීඩා පරිසරයක් උදෙසා සුවිසල් සේවයක් සිදු කිරීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට හැකි වේවා යැයි මම සුභාශිංසන එක් කරමි.

වෛද්‍ය ශිරෝමී පිලපිටිය ද අල්විස්

අධ්‍යක්ෂ ජනරාල්

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

අධ්‍යක්ෂ මණ්ඩලය - 2023



මහාචාර්ය අර්ජුන ද සිල්වා මහත
සභාපති



මහාචාර්ය ලාල් ජයකොඩි මහත
සාමාජික



මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු මහත
සාමාජික



මහාචාර්ය ශෙමාල් ප්‍රනාන්දු මහතා
සාමාජික



ඒ.පේ.එස්.එස්.එදිරිසූරිය මහතා
සාමාජික



වෛද්‍ය ලාල් ඒකනායක මහතා
සාමාජික



සජිත් ජයලාල් මහතා
සාමාජික



එච්.එම්.එස්.ධර්මවර්ධන මහතා
සාමාජික



වෛද්‍ය අන්වර් හම්ඩාන
සාමාජික



වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන
සාමාජික



අනුර මුතුමාල මහතා
සාමාජික



ඩබ්.ඒ. කුලසූරිය මහතා
සාමාජික

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

නීතිමය තත්ත්වය

ක්‍රීඩාවේ දී තහනම් උත්තේජක ගැනීමට එරෙහිව ජාත්‍යන්තර සම්මුතියේ ප්‍රතිපාදන ක්‍රියාත්මක වෙමින්, ඊට අදාළ දේශීය නෛතික යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (SLADA) පිහිටුවන ලදි.

මෙම ආයතනය 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව

2013 අංක 33 දරන ක්‍රීඩාවේ යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 15 වන වගන්තිය යටතේ නියෝජ්‍යායතනයේ පරමාර්ථවලට සම්බන්ධ යම් කාරණයක් හා සියලු කාරණා පිළිබඳව ද අමාත්‍යවරයාට උපදෙස් දීම මණ්ඩලයේ වගකීම වේ. තව ද පනතේ අංක 16වන වගන්තිය ප්‍රකාර ව, අමාත්‍යවරයා විසින් ලියවිල්ලක් මගින් කලින් කලට විශේෂ හෝ පොදු විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

පරිපාලන භූමිකාව

2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතට අනුව, නියෝජ්‍යායතනයේ කටයුතු පරිපාලනය, කළමනාකරණය සහ පාලනය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ.

නියෝජ්‍යායතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා මණ්ඩලය විසින්, මේ පනත මගින් නියෝජ්‍යායතනය වෙත පවරන ලද හෝ ඒ මත පනවන ලද හෝ එයට භාර දෙන ලද බලතල, කාර්යය හා කාර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම කළ යුතු ය.

නායකත්ව භූමිකාව

එහි නායකත්ව භූමිකාව තුළ, අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරීවලට, පාලනය සහ පහත සඳහන් ක්‍රියාකාරීත්වයට මග පෙන්වීම ඇතුළත් විය යුතු ය.

* උත්තේජක මර්දන ක්‍රියා සැලසුම් කිරීම, සම්බන්ධීකරණය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.
* උත්තෙජක මර්දන නීති උල්ලංඝනය කිරීම්වලට එරෙහිව පියවර ගැනීම.
* යම් චංචල හෝ නිශ්චල දේපලක් (විකිණීමෙන්, ත්‍යාග මගින් හෝ අන්‍යාකාරයකින්) අත්කර ගැනීමට, දැරීමට, බද්දට හෝ දීමට, උකස් කිරීමට, ඔඩපනය කිරීමට සහ විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.
* කිසියම් බැංකුවක ජංගම හා ඉතිරිකිරීමේ ගිණුම් ආරම්භ කර පවත්වාගෙන යෑම.
* ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර තැනැත්තන්ගේ හෝ පුද්ගල මණ්ඩලවලින් පරිත්‍යාග භාර ගැනීම.

* නියෝජ්‍යායතනයේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හෝ එහි කර්තව්‍යන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් සියලු ම ගිවිසුම්වලට ඇතුල් වීම හෝ ඉටු කිරීම.
* නියෝජ්‍යායතනයට අයිති මුදල් කිසිවක් ආයෝජනය කිරීම.
* එහි කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි යම් මුදල් ප්‍රමාණයක් ණයට ගැනීම.
* මෙම පනත යටතේ නියෝජ්‍යායතනයේ කර්තව්‍යන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, පරිශ්‍රමය දීම හා ඔවුන් විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ ඒ සේවකයන් පහ කිරීම.
* නියෝජ්‍යායතනය විසින් සපයන ලද සේවා සහ සහාය වෙනුවෙන් ගාස්තු අය කිරීම.
* එහි කර්තව්‍යන් ඉටු කිරීම සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය යැයි නියෝජ්‍යායතනය අදහස් කරන වෙනත් යම් සියලු ම දේ සිදු කිරීම.

සංයුතිය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා ඇතුලුව සාමාජිකයින් දස දෙනෙකුගෙන් සමන්විත වේ.


- මහාචාර්ය අර්ජුන ද සිල්වා මහතා - සභාපති
- මහාචාර්ය ලාල් ජයකොඩි මහතා - සාමාජික
- මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා - සාමාජික
- මහාචාර්ය ශෙමාල් ප්‍රනාන්දු (2023 ජූලි මස සිට සාමාජිකත්වයට පත් කරන ලදී.)
- සජිත් ජයලාල් මහතා - සාමාජික
- ඒ.ජේ.එස්.එස්. එදිරිසූරිය මහතා - සාමාජික (2023 මාර්තු මස සිට සාමාජිකත්වයෙන් ඉවත් විය.)
- ඩබ්ලිව්.ඒ. කුලසූරිය මහතා - සාමාජික
- වෛද්‍ය ලාල් ඒකනායක මහතා - සාමාජික
- වෛද්‍ය අන්වර් හම්දානි මහතා - සාමාජික
- එච්.එම්.එස්. ධර්මවර්ධන මහතා - සාමාජික
- වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන මහතා - සාමාජික
- අනුර මුතුමාල මහතා (2023 අප්‍රේල් මස සිට ජුනි මස දක්වා සාමාජිකත්වය දරන ලදී.)

රැස්වීම් සහ පැමිණීම

අධ්‍යක්ෂ මණ්ඩලය 2023 වසර සඳහා අවස්ථා 12ක දී රැස් වූ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ පැමිණීම පහත සඳහන් පරිදි වේ.

නම	26th ජනවාරි	23rd පෙබරවාරි	23rd මාර්තු	25th අප්‍රේල්	17th මැයි	22nd ජූනි	20th ජූලි	22nd අගෝස්තු	19th සැප්තැම්බර්	19th ඔක්තෝම්බර්	23rd නොවැම්බර්	21st දෙසැම්බර්
මහාචාර්ය අර්ජුන ද සිල්වා	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓
සජිත් ජයලාල් මහතා	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	_	✓
ඒ.ජේ.එස්.එස්. එදිරිසූරිය මහතා	_	✓	✓									
ඩබ්ලිව්.ඒ. කුලසූරිය මහතා	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓
වෛද්‍ය ලාල් ඒකනායක	✓	✓	✓	✓	✓	✓	_	✓	✓	✓	✓	✓
මහාචාර්ය ලාල් ජයකොඩි	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	✓	_
වෛද්‍ය අන්වර් හම්දානි	✓	✓	✓	_	_	✓	_	✓	✓	_	✓	✓
මහාචාර්ය රවීන්ද්‍ර ප්‍රනාන්දු	✓	_	✓	✓	✓	_	✓	✓	_	✓	✓	_
එච්.එම්.එස්.ධර්මවර්ධන මහතා	✓	✓	✓	✓	✓	✓	✓	✓	_	✓	✓	✓
වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන	✓	_	✓	✓	_	✓	✓	✓	_	_	✓	_
අනුර මුතුමාල මහතා				✓	✓	✓						
මහාචාර්ය ශෙමාල් ප්‍රනාන්දු							✓	✓	_	✓	✓	✓

සංවිධාන ව්‍යූහය


සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පරීක්ෂණ)
අධ්‍යක්ෂ(බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම)
සහකාර අධ්‍යක්ෂ
ගණකාධිකාරි
නීති නිලධාරි/ මාණ්ඩලික ලේකම්
සහකාර අධ්‍යක්ෂ
පර්යේෂණ නිලධාරි(03)
තොරතුරු තාක්ෂණ නිලධාරි
පරිපාලන නිලධාරි
භාෂා පරිවර්තක
සංවර්ධන නිලධාරි (01)
තාක්ෂණ සහකාර (01)
කළමනාකරණ සහකාර
රියදුරු (04)
කාර්යාල සහායක (03)
තාක්ෂණ සහකාර (01) (පර්යේෂණාගාර)
කළමනාකරණ සහකාර
සංවර්ධන නිලධාරි
සංවර්ධන නිලධාරි
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
HM
MM 1.1
AR-1
JM
MA-4
MA-3
MA1-1
MA 2-1
PL-3
PL-1

කාර්ය මණ්ඩල තොරතුරු

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වෙත 29දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇත.

	තනතුරු නාමය	වැටුප් තලය	තනතුරු සංඛ්‍යාව	වර්තමාන සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
1.	අධ්‍යක්ෂ ජනරාල්	HM 2-1	1	1	-
2.	අධ්‍යක්ෂ	HM 1-1	2	1	1
3.	සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ	MM 1-1	2	2	-
4.	ගණකාධිකාරී	MM 1-1	1	-	1
5.	නීති නිලධාරී/ අධ්‍යක්ෂ මණ්ඩලය ලේකම්	MM 1-1	1	1	-
6.	පර්යේෂණ නිලධාරී	AR 1	3	2	1
7.	පරිපාලන නිලධාරී	JM 1-1	1	-	1
8.	තොරතුරු තාක්ෂණ නිලධාරී	JM 1-1	1	-	1
9.	භාෂා පරිවර්තක	MA-4	1	1	-
10.	සංවර්ධන නිලධාරී	MA 3	3	-	3
11.	කළමනාකරණ සහකාර	MA 1-1	4	3	1
12.	තාක්ෂණ සහකාර	MA 2-1	2	1	1
13.	රියදුරු	PL 3	4	2	2
14.	කාර්යාල කාර්ය සහායක	PL 1	3	3	-
එකතුව			**29**	**17**	**12**

කාර්ය මණ්ඩලය



මෙහෙයුම් ප්‍රගතිය

අධ්‍යාපන අංශය හා පරීක්ෂණ

2023 වර්ෂයට අදාළ තහනම් උත්තේජක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ සාරාංශගත තොරතුරු

ඉලක්ක පාර්ශවය		පවත්වන ලද වැඩසටහන් ගණන	සහභාගී වූ ප්‍රමාණය
1	ජාතික ක්‍රීඩා කණ්ඩායම් හා ජාතික ක්‍රීඩක ක්‍රීඩිකාවන්  	10	282
2	ආසියානු ක්‍රීඩා උළෙල සඳහා සහභාගී වන කණ්ඩායම් සහ ක්‍රීඩක ක්‍රීඩිකාවන්  	6	63
3	ජාතික ක්‍රීඩා සම්මේලන හා පළාත් ක්‍රීඩා පුහුණුකරුවන්  	6	297
4	කනිෂ්ඨ ජාතික කණ්ඩායම් සහ ජ්‍යෙෂ්ඨ අන්තර් සමාජ කණ්ඩායම්  	13	405

5	ක්‍රීඩාව හා සම්බන්ධ උපාධි හා උසස් අධ්‍යාපන පාඨමාලා හදාරන්නන්  	6	236
6	ක්‍රීඩාව සඳහා ඇල්මක් දක්වන සාමාන්‍ය මහජනතාව  	4	1152
එකතුව		**45**	**2435**

තහනම් උත්තේජක පරීක්ෂණ

ශ්‍රී ලංකාව තුළ තහනම් උත්තේජක භාවිතයෙන් තොර පිරිසිදු ක්‍රීඩා පරිසරයක් බිහි කිරීමත් පිරිසිදු ක්‍රීඩක ක්‍රීඩිකාවන් ආරක්ෂා කිරීමත් අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මගින් 2023 වසර තුළ සිදු කරන ලද තහනම් උත්තේජක පරීක්ෂණ පිළිබඳ තොරතුරු පහත සඳහන් වේ .

අනු අංකය	ක්‍රීඩාව	තරග තුළ දී සිදු කළ පරීක්ෂණ	තරග වලින් පිටත දී සිදු කළ පරීක්ෂණ	මුළු තහනම් උත්තේජක පරීක්ෂණ ගණන	තහනම් උත්තේජක ලබාගත් බවට සනාථ වූ අවස්ථා
1.	රග්බි	32	5	37	1
2.	ක්‍රිකට්	24	1	25	-
3.	පාපැදි	14	1	15	1
4.	බර ඉසිලීම	4	5	9	1
5.	බීච් වොලිබෝල්	8	-	8	-
6.	රග්බි	4	3	7	-
7.	පැරා මළල ක්‍රීඩා	-	7	7	-
8.	සවි එසවීම	5	1	6	1
9.	පා පන්දු	4	-	4	-
10.	කබඩි	4	-	4	-
11.	ඔරු පැදීම	-	3	3	-
12.	පැරා පිහිනුම්	-	1	1	-
13.	පිහිනුම්	3	-	3	-
14.	ජිම්නාස්ටික්	-	-	1	-
එකතුව		**102**	**28**	**130**	**4**

නීති අංශය

2023 වසරේ ප්‍රගතිය

- තහනම් උත්තේජක ලබාගත් බව තහවුරු වූ ක්‍රීඩකයන් සඳහා 2023 වසරේ දී,
  - පවත්වන ලද මූලික පරීක්ෂණ ගණන - 4
  - පවත්වන ලද විනය පරීක්ෂණ ගණන - 4
  - පවත්වන ලද අභියාචනා පරීක්ෂණ ගණන - 1
- පවත්වන ලද සියලු ම විනය සහ අභියාචන පරීක්ෂණවල සටහන් සහ තීන්දු සම්බන්ධ ලේඛන කටයුතු අවසන් කර ඇත.
- තහනම් උත්තේජක ලබාගත් බව තහවුරු වූ අවස්ථාවේ සිට අවසාන තීන්දුව ලබාදෙන තෙක් එක් එක් ක්‍රීඩකයාට අදාළ සම්බන්ධීකරණ කටයුතු කිරීම සහ ලිපි ගොනු නීති අංශය තුළ පවත්වා ගනී.
- වසර තුළ දී සංවිධානය කරන ලද අධ්‍යක්ෂ මණ්ඩක රැස්වීම් ගණන 12ක් වේ.
- 2023 වසර සඳහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙන් ප්‍රකාශ කළ තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව ගැසට් පත්‍රයේ පළ කිරීම හා සම්බන්ධ කටයුතු සම්පාදනය කරන ලදී.
- අධ්‍යාපන වැඩසටහන්වල දී තහනම් උත්තේජක සම්බන්ධ නෛතික පසුබිම පිළිබඳ දැනුවත්කිරීම නීති අංශය මගින් සිදු කරන ලදී.
- ලෝක තහනම් උත්තේජක සම්බන්ධ නීති තත්තවයේ යාවත්කාලීනවීම් සඳහා අනුගත වෙමින් ලංකාව තුළ තහනම් උත්තේජක සම්බන්ධ නීති තත්ත්වය ක්‍රියාත්මක කරන ලදී.

2024 වසර සඳහා ඉලක්ක

- මාසික ව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය සහ වාර්තා නිසි පරිදි පිළියෙල කිරීම.
- තහනම් උත්තේජක ලබාගත් බව තහවුරු වන සියලු ම ක්‍රීඩකයන් සඳහා මූලික පරීක්ෂණ, විනය පරීක්ෂණ සහ අභියාචනා පරීක්ෂණ නියමිත පරිදි පවත්වා අවසන් කිරීම.
- තහනම් උත්තේජක ලබාගත් බව තහවුරු වූ අවස්ථාවේ සිට අවසාන තීන්දුව ලබා දෙන තෙක් එක් එක් ක්‍රීඩකයාට අදාළ සම්බන්ධීකරණ කටයුතු කිරීම සහ ලිපි ගොනු පවත්වාගෙන යාම.
- විනය පරීක්ෂණ සහ අභියාචනා පරීක්ෂණ තීන්දු නිසි පරිදි සකස්කර අදාළ පාර්ශව අතර සන්නිවේදනය කිරීම.
- ලෝක තහනම් උත්තේජක සම්බන්ධ නීති තත්ත්වයේ යාවත්කාලීනවීම් සඳහා අනුගත වෙමින් ලංකාව තුළ තහනම් උත්තේජක සම්බන්ධ නීති තත්ත්වය ක්‍රියාත්මක කිරීම.
- 2024 වසර සඳහා ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙන් ප්‍රකාශ කළ තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව ගැසට් පත්‍රයේ පළ කිරීම සහ පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම හා සම්බන්ධ කටයුතු සම්පාදනය කිරීම.
- අන්තර්ජාතික අශ්ව ක්‍රීඩා සම්මේලනය මගින් ප්‍රකාශ කළ අශ්ව ක්‍රීඩා හා තුරඟ තරග සඳහා වන තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව ගැසට් පත්‍රයේ පළ කිරීම සහ පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම හා සම්බන්ධ කටයුතු සම්පාදනය කිරීම.
- අධ්‍යාපන වැඩසටහන්වල දී තහනම් උත්තේජක සම්බන්ධ නෛතික පසුබිම පිළිබඳ ව දැනුවත් කිරීම් සිදුකිරීම.

බලාත්මක කිරීම් හා ක්‍රියාත්මක කිරීමේ අංශය

2023 වර්ෂයේ ප්‍රගතිය

වැඩසටහන	වැඩසටහන් ප්‍රමාණය	සහභාගී වූ ප්‍රමාණය
පුහුණු වැඩසටහන්	8	924
එළිමහන් දැනුවත් කිරීමේ කුටි	5	1509

පැමිණිලි සහ විමර්ශන වාර්තා	ප්‍රමාණය	සහභාගී වූ ප්‍රමාණය
ලද පැමිණිලි	9	9
අභ්‍යන්තර මූලික විමර්ශන වාර්තා	4	4



වලාන දූෂණ මර්දන ප්‍රහාරක ඒකකය, ශ්‍රී ලංකා ඖෂධ නියාමන අධිකාරිය සහ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය එක් ව සිදු කරන ලද විශේෂ තහනම් උත්තේජක වැටලීමක් 2023 අගෝස්තු 16වන දින දී සිදු කරන ලදි.



2023.05.03වන දින මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ සිදු කරන ලද පොලිස් නිලධාරී දැනුවත් කිරීමේ වැඩසටහන



2023.06.14වන දින පවත්වන ලද තහනම් උත්තේජක විමර්ශන කටයුතු සහ බුද්ධි තොරතුරු පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණය





2023.08.28වන දින පවත්වන ලද එළිමහන් දැනුවත් කිරීමේ කුටිය - සුගතදාස ක්‍රීඩාංගණය

පර්යේෂණ අංශය

01. කැලණිය විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා විද්‍යාව හා ශාරීරික අධ්‍යාපන අධ්‍යන අංශය සමඟ පර්යේෂණ සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදි.
02. SLADA පර්යේෂණ අංශය හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අධ්‍යයන අංශය අතර අවබෝධතා ගිවිසුමක් ඇතිකර ගැනීම සඳහා මූලික සාකච්ඡා පවත්වන ලදි.
03. SLADA පර්යේෂණාගාරයේ LC-MS/MS උපකරණයේ දේශීය හා විදේශ පුහුණුව අවසන් කර උපකරණය භාවිතා ආරම්භ කරන ලදි.
04. SLADA පර්යේෂණාගාරය හා LC-MS/MS උපකරණය භාවිතා කර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ රසායනික විද්‍යා අධ්‍යන අංශය සමඟ සම්බන්ධ වී පර්යේෂණ 5 ක් ආරම්භ කරන ලදි.
05. SLADA පර්යේෂණ අංශය හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ Pharmacy and Pharmaceutical Science අධ්‍යාපන දෙපාර්තමේන්තුව සමඟ SLADA පර්යේෂණාගාරය හා LC-MS/MS උපකරණය භාවිතා කර පර්යේෂණයක් කරගෙන යාම ආරම්භ කරන ලදි.
06. SLADA පර්යේෂණ අංශය හා කැලණිය විශ්ව විද්‍යාලයේ ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව අතර social science වර්ගයේ පර්යේෂණ සහයෝගයෙන් කර ගෙන යාමට ආරම්භ කරන ලදි.
07. SLADA පර්යේෂණාගාර උපකරණ නඩත්තු කරමින් රසායන ද්‍රව්‍ය හා අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගනිමින් පර්යේෂණාගාරය පවත්වා ගෙන යාම.
08. විද්‍යුත් තාක්ෂණය ඔස්සේ පර්යේෂණ සොයාගැනීම, ක්‍රීඩා ප්‍රජාව හා මහජනයා අතර බෙදා හැරීම.
09. කැළණිය විශ්ව විද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ආචාර්යවරු සමඟ එක් ව WADA Social Science Research grant 2023 වෙත පර්යේෂණ යෝජනාවක් ඉදිරිපත් කිරීම.

ඡායාරූප:







(කැලණිය විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා විද්‍යාව හා ශාරීරික අධ්‍යාපන අධ්‍යන අංශය සමඟ පර්යේෂණ කටයුතු සඳහා අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම.)









(ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා දෙපාර්තමේන්තුව සමඟ එක්ව රසායනාගාර පර්යේෂණ පැවැත්වීම.)

18වන ආසියානු ශාන්තිකර කලාපීය අන්තර් රාජ්‍ය සමුළුව

පිරිසිදු ක්‍රීඩාව පිළිබඳ 18 වන ආසියානු ශාන්තිකර කලාපීය අන්තර් රාජ්‍ය සමුළුව සිනමන් ලේක් සයිඩ් හෝටලයේ දී සහ නෙළුම් කුළුණ පරිශ්‍රයේ දී රටවල් 40ක උත්තේජ මර්දන ආයතන ප්‍රධානීන්ගේ සහ ක්‍රීඩා අමාත්‍යවරුන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.



තිරසාරභාවය පිළිබඳ වාර්තාව

''ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වගකීමෙන් යුතු වර්ධනයක් සඳහා කැප වී සිටින අතර, එය ස්වකීය ආයතනික අරමුණු හරහා ශ්‍රී ලාංකීය ක්‍රීඩකයින්ට ක්‍රමයෙන් නියත හා තිරසාර වටිනාකමක් නිර්මාණය කර දෙයි.''



ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මූලික වශයෙන් ම තිරසාරභාවය පවත්වාගත් ආයතනයකි. ආරම්භයේ සිට ම ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය හුදෙක් එහි පාර්ශවකරුවන්ගේ සුබසිද්ධියට වඩා වැඩි යමක් සැලකිල්ලට ගනිමින් ක්‍රීඩකයින්ගේ සමස්ත දිගු කාලීන අවශ්‍යතා හා සාරධර්ම සමඟ නොගැටෙන බව සහතික ලෙස විශ්වාස කරයි. මණ්ඩලයේ තිරසාරභාවය පිළිබඳ වාර්තාව එහි පැතිකඩ, තිරසාරභාවය සඳහා වන උපායමාර්ග, ආර්ථික වගකීම සහ පාරිසරික වගකීම යන ඒවායින් සමන්විත වේ.

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වගකීමෙන් යුතු වර්ධනයක් සඳහා කැප වී සිටින අතර එය ස්වකීය අරමුණු ළඟා කර ගැනීම හරහා ක්‍රීඩකයන්ට ක්‍රමයෙන් නියත සහ තිරසාර වටිනාකමක් නිර්මාණය කර දෙයි. මෙම වාර්තාව මඟින් සමාජ, පාරිසරික හා ආර්ථික වගවීම පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග අවධාරණය කර ඇත. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි සමාජ වගකීමට නියෝජ්‍යායතනයේ, ක්‍රීඩකයන්ගේ සහ ශ්‍රී ලාංකිකයන්ගේ ආරක්ෂාව සඳහා ගෙන ඇති වගකීම් සහගත ක්‍රියාමාර්ග ඇතුළත් වේ. පාරිසරික වගකීම සාක්ෂාත් කර ගැනීම පිණිස අපගේ නියෝජ්‍යායතනය ස්වකීය ආයතනික ක්‍රියාකාරකම්වල පාරිසරික බලපෑම අධීක්ෂණය කරමින් පරිසර හිතකාමී ආයෝජන සිදු කරයි. ආර්ථික වගකීම, විනිවිදභාවයෙන් යුතු සහ සමබර වන පාලන ආකෘතියක් බවට පරිවර්තනය වෙයි.

අපගේ මූලික සාරධර්ම

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය කැපවීමෙන් යුතු සහ දැඩි ලෙස උද්යෝගිමත් සේවකයින් සම්බන්ධයෙන් සඳහන් කිරීමේ දී, ඔවුන් අපට අතිමහත් සහයෝගයක් ලබා දී ඇත. තමන් ද එහි කොටසක් වීම ගැන ඔවුන්ට ආඩම්බර විය හැකි පරිසරයක් නිර්මාණය කිරීමට අප මහත් සේ වෙහෙසෙන්නේ එබැවිනි. අපගේ ශ්‍රම බලකායෙහි විශිෂ්ටත්වය සහ සාර්ථකත්වය දිරිගැන්වීම පිණිස පුහුණුව හා අඛණ්ඩ අධ්‍යාපනය සඳහා අවස්ථා ලබා දීම මගින් අප අපගේ සේවක පිරිස ආයෝජනය කරනුයේ අපගේ ආයතනයේ සාර්ථකත්වය රදා පවතින්නේ තම රැකියාව පිළිබඳ ව ඔවුන්ගේ ඇති තෘප්තිමත්භාවය මත වන බව අපි අවබෝධ කරගෙන සිටින බැවිනි.

පාරිසරික වගකීම

පරිසරයට වන බලපෑම අවම කිරීම සඳහා අප විසින් දරන ලද ප්‍රයත්නයන් සාර්ථක වී ඇත. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සේවකයන් සඳහා පරිපූර්ණ පුහුණුව, නව්‍ය තාක්ෂණය සහ පාර්ශවකරුවන් සමඟ සහයෝගීතාව හරහා ඵලදායී සහය සේවාවන් සපයා දීමට දොරටුවක් විවර කර දෙයි. අප විසින් ඇන්ඩ්‍රොයිඩ් අප්ප් යෙදවුම හඳුන්වා දීම මෙම අරමුණුවලට සාක්ෂි වේ. ඩිජිටල්කරණය හරහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ස්වකීය ක්‍රීඩකයන්ගේ පහසුව උදෙසා වැඩි වැඩියෙන් යෙදවුම් සහ ඊ-සේවා හඳුන්වා දෙමින් ජෑවිය මත කාබන් පියසටහන අවම කිරීමට ඉලක්ක කරයි. අපි පාරිසරික බලපෑම පිළිබඳ ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මෙහෙයුම් වැඩිදියුණු කිරීමට සහ සේවකයින් අතර හරිත දැනුවත්භාවයක් වැඩි කිරීමට ද අදහස් කරන්නෙමු. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය තිරසාර වටිනාකමක් නිර්මාණය කරමින් කැප වූ සංවර්ධනයක් කෙරෙහි අවධානය යොමු කරයි. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ස්වකීය ආයතනික ව්‍යායාමයන්හි පාරිසරික බලපෑම් අධීක්ෂණය කරන අතර පාරිසරික වගකීම ඉටුකිරීම පිණිස බලශක්තිය ඉතිරි කිරීමේ ආයෝජනය ද සිදු කරයි.

අපගේ සමාජ වගකීම

අපගේ ආයතනික සමාජ වගකීම් ප්‍රතිපත්ති පදනම් කරගෙන අපව වටිනා ප්‍රජා සාමාජිකයෙකු ලෙස පිළිගනු ලැබීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අපට අවශ්‍ය ය. එම නිසා අර්ථාන්විත, දිගුකාලීන හවුල්කාරිත්වයන් තුළින් ක්‍රීඩකයන්ට සහ ප්‍රජාවට දායකත්වය සපයා දීමට සහ පාරිසරික වශයෙන් තිරසාර ආකාරයකින් ආයතනික කටයුතු කරගෙන යාමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය අවධානය යොමු කරයි.

මානව සම්පත්

යහපත් ව්‍යාපාරික පිළිවෙත් සංවර්ධනය කිරීමේ දී සහ කල්පවත්නා පාරිභෝගික සම්බන්ධතා ගොඩනැගීමේ දී අපගේ සේවකයන්ගේ වැදගත් කාර්යභාරය අපි පිළිගැනීමට ලක් කරන්නෙමු. අපි අපගේ සේවකයින්ව ඉතා දැඩි ලෙස අගය කරන අතර, ඔවුන් ලබාදෙන ඉතා වටිනා දායකත්වයන් පිළිබඳ අපගේ ඇගයීම පෙන්නුම් කිරීම සඳහා නව්‍ය, සහයෝගී සහ ආකර්ෂණීය සේවා ස්ථානයක් නිර්මාණය කර ලබා දුන්නෙමු.

කාර්ය මණ්ඩල සංවර්ධනයෙහි අරමුණු

- රැකියා සහ වෘත්තීය අවස්ථා නිර්මාණය කිරීම හා දිරිමත් කිරීම.
- ශ්‍රම බලකාය සැලසුම් කිරීම සහ නිපුණතා කළමනාකරණ වැඩසටහන්, ගුණාත්මක බඳවා ගැනීම් සහ රඳවා ගැනීමේ ක්‍රියාමාර්ග, නායකත්ව සහ අනුප්‍රාප්තික සැලසුම්කරණය සංවර්ධනය කිරීම සහ අඛණ්ඩ අධ්‍යාපනික දැනුම ලබා දීම අඛණ්ඩව වැඩිදියුණු කිරීම.
- අපගේ සේවකයින්ව සවිබල ගන්වනු ලබන බව සහ ඔවුන්ගේ ජයග්‍රහණ සඳහා ඔවුන්ට දිරිගැන්වීම් ලබා දෙනු ලබන බව සහතික කිරීම.
- ආයතනික ක්‍රමෝපායික දිශාව පිළිබඳ ව අපගේ කාර්ය මණ්ඩලය හොඳින් දැනුවත් කර සහ දැන සිටි බව සහතික කිරීම.

ආයතනික පාලනය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය පාලන පද්ධතියේ තීරණ ගැනීම සඳහා වන පරිචයන් මත මගපෙන්වීමේ ප්‍රතිපත්ති නිර්වචනය කර දෙන අතර ම, නියෝජ්‍යායතනයේ දිගුකාලීන අරමුණු සහ උපාය මාර්ගික සැලසුම්වලට මග පෙන්වයි. ආයතනික පාලන ආකෘතිය මගින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි විවිධ මට්ටම් අතර, විශේෂයෙන් ම පාලනයෙහි මට්ටම් අතර, එනම් අධ්‍යක්ෂ මණ්ඩලය සහ විධායක කළමනාකරණ මට්ටම් අතර බලතල සහ වගකීම් බෙදී යන ආකාරය සංක්ෂිප්තව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනික ප්‍රතිපත්ති ස්ථාපනය කරන අතර, අප ආයතනයේ මනා ක්‍රියාකාරිත්වය සඳහා වගකිව යුතු පුද්ගලයින් වන ප්‍රධාන විධායක නිලධාරීන් සහ විධායක නිලධාරීන්ට ක්‍රමෝපායික මග පෙන්වීමක් සපයා දෙයි.

අප ආයතනය 2013 අංක 13 දරන ක්‍රීඩා ක්‍රීඩාවේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත මගින් පාලනය වේ. එම පනතෙහි 14(i) වගන්තිය මගින් මණ්ඩලයේ ව්‍යුහය පහත දක්වා ඇති පරිදි දක්වා ඇත.

(අ) පහත සඳහන් නිල බලයෙන් පත්වන සාමාජිකයින්:

i. ක්‍රීඩා විෂය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම්වරයා නම් කරන ලද ජ්‍යෙෂ්ඨ ස්ථ සහකාර ලේකම්වරයාගේ නිලයට වඩා අඩු නොවන ධූරයක් දරන නිලධාරිවරයා;
ii. ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ-ජනරාල්වරයා;
iii. ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා;
iv. ජාතික ක්‍රීඩා විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා;

(ආ) අමාත්‍යවරයා විසින් පත්කරන ලද නීතිය, ක්‍රීඩා වෛද්‍ය සහ ක්‍රීඩා විද්‍යාව යන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වයට පත් වූ(මෙහි මින්මතු ''පත්කළ සාමාජිකයන්'' යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් හය දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා පත් කළ යුතු අතර, මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා ද එම සභාපතිවරයා මණ්ඩලයේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය

රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජ්‍යායතනයේ කාර්යක්ෂම කළමණාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේ ය. සියලු ව්‍යවස්ථාපිත හා කළමනාකරණ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල වන අතර ම, සම්පත් ආරක්ෂා කිරීම, ප්‍රමාණවත් පරිදි ගිණුම් පවත්වා ගැනීම සහ නිවැරදි වාර්තා සම්පාදනය සහතික කරමින් මෙය ඉටු කරගත යුතු ය.

එබැවින් අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් දෑ සහතික කළ යුතු ය:

- සංවිධානයේ උපායමාර්ගික අරමුණු ක්‍රියාත්මකව පවතින බව සහතික කිරීම.
- උපයමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නායකත්වය ලබා දීම.
- ඵලදායී අභ්‍යන්තර පාලනයක් සහ අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වන බවට සහතික කිරීම.
- ආයතන කළමනාකරණ කටයුතු ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම.
- නීතිපතා වන පදනමකින් අවශ්‍ය කරනු ලබන මූල්‍ය අංග සහ අනාවරණයන් පිළිබඳ ව ප්‍රමාණවත් ලෙස වාර්තා කිරීම.
- සම්පත් හා වත්කම් වගකීමෙන් යුතුව භාවිතා කිරීම.
- විගණන කමිටුව සහ අනෙකුත් කමිටු පත් කිරීම; සහ චර්යාධර්ම හා ආචාරධර්ම පද්ධතියක් සහ ආයතනික පාලන උපාය මාර්ගයක් හඳුන්වා දීම.
- අදාළ අණ පනත්, මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ ආදිය ප්‍රකාර ව ඔවුන්ගේ සියලු ක්‍රියාමාර්ග සඳහා වගකිව යුතු වීම.
- අවම වශයෙන් වාර්ෂිකව හෝ ප්‍රධාන විධායක සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය පිළිබඳ ඇගයීමක් කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

නියෝජ්‍යායතනයේ මෙහෙයුම් සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල ප්‍රතිඵල අයවැය සහ අදාළ ප්‍රමිතීන්ට අනුකූල ව දැඩි ලෙස හා නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය සවිස්තරාත්මක ව අවශ්‍ය කරන අනෙකුත් කාරණා සමඟ සම්මත න්‍යාය පත්‍රයක් අනුගමනය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය මසකට වරක් රැස්වන අතර අවශ්‍ය ඕනෑම අවස්ථාවක විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට කටයුතු කරයි.

නියෝජ්‍යායතනයේ පිහිටුවා ඇති කමිටු

1. චිකිත්සකමය භාවිත මුක්තිය පිළිබඳ කමිටුව (T.U.E)
2. විනය මූලික මණ්ඩලය
3. අභියාවනා මූල මණ්ඩලය
4. විගණන සහ කළමනාකරණ කමිටුව
5. ප්‍රසම්පාදන කමිටුව

කළමනාකාරීත්වය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ දෛනික මෙහෙයුම් කටයුතු ප්‍රධාන විධායක නිලධාරීන්ගේ හා ඉහළ කළමනාකරන සහ ජේෂ්ඨ කළමනාකරණ කණ්ඩායම් වෙත පවරා තිබේ. අවදානම් සහ අවස්ථාවන් හඳුනා ගනු ලබන බව සහ නියමිත වේලාවලට අවශ්‍ය පියවර ගනු ලබන බවත්, ඉලක්ක සපුරා ගැනීම සඳහා අයවැය සකස් කරනු ලබන බවත් එම කණ්ඩායම් විසින් සහතික කරනු ලබයි.

අවදානම් කළමනාකරණ වාර්තාව

ඵලදායී අවදානම් කළමනාකරණය උත්තේජක මර්ධන ක්‍රියාවලියේ ප්‍රධාන සාධකයකි. අප ආයතනයේ අවදානම් හා ප්‍රතිඵල අතර උචිත සමතුලිතතාවයක් ඇති කර ගැනීමට සහ පාලිත පරිසරයක් තුළ අපගේ වර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට උපකාරී වන අවධානම් කළමනාකරණ හැකියාවන් අඛණ්ඩ ව වැඩිදියුණු කර ගැනීමට අපි උත්සාහ කරන්නෙමු. අවදානම් කළමනාකරණය ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්ධන නියෝජ්‍යායතන මෙහෙයුම් ව්‍යුහයේ ප්‍රධානතම අංගයක් වෙයි. මුහුණ දීමට සූදානම් ව සිටින අවදානම් මට්ටම ඇතුළත අවදානම් නිරාවරණය වීම කළමනාකරණය කිරීම මගින් ඉපැයීම්වල සහ ප්‍රාග්ධනයෙහි අහිතකර විචලනයන් සීමා කර ගැනීමට උත්සාහ කරන්නෙමු.

අවදානම් හඳුනා ගැනීම සහ අවම කිරීම සඳහා වගකීම් සහතික ප්‍රවේශයක් කළමනාකරණ පද්ධතියට ඇතුළත් වේ. අවදානම් දැනුවත් කිරීමේ චර්යාවන්ට සහාය දෙන ශක්තිමත් අවදානම් කළමනාකරණ සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ එමගින් අවදානම් මත පදනම්ව තීරණ ගැනීමට අනුබලය දීම අපගේ ප්‍රධාන අවධානය වී තිබේ. ආයතනයේ දිගු කාලීන තිරසාර බව සහතික කිරීම සඳහා අපි අපගේ අවදානම් උපායමාර්ග තවදුරටත් වැඩිදියුණු කරන්නෙමු.

ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි අවදානම් කළමනාකරණ උපායමාර්ග විශේෂිත පාර්ෂවකරුවන්, කළමනාකරුවන් සහ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ප්‍රතිපෝෂණ ක්‍රමවේදයක් ලෙස ක්‍රියාත්මක වේ. ආයතනයේ ව්‍යාපාර, මෙහෙයුම්, පද්ධති සහ සේවාවන් සඳහා දැනුවත්භාවයෙන් යුතු තීරණ ගැනීමේ උපායමාර්ගික කේන්ද්‍රයක් ලෙස එයට හිමිවන තත්ත්වයෙන් එය සුවිශේෂී වේ.මෙය පහත සඳහන් දෑ හරහා ව්‍යාපාර අවදානම්වලට ආමන්ත්‍රණය කිරීම සඳහා උපායමාර්ගික සහ ව්‍යාපාරික සැලසුම්කරණයට, ව්‍යාපෘති කළමනාකරණයට සහ ව්‍යාපාර ක්‍රියාවලි මට්ටම්වලට ස්ථාවර ප්‍රවේශයක් සපයා දෙයි:

- ව්‍යාපාර කාර්යයන් සහ ඒකක පුරා ඇති අවදානම් පිළිබඳ ව පොදු අවබෝධයක් ලබා දීම.
- වැඩිදියුණු වූ ප්‍රමුඛතා නියම කරගැනීම සහ තීරණ ගැනීම සඳහා පහසුකම් සැලසීම පිණිස කළමනාකරණයට අඛණ්ඩ අවදානම් තත්සේරුවක් සපයා දීම.
- සේවක දැනුවත්භාවය සහ කළමනාකරණ වගකීම් වැඩි කිරීම ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය පහත සඳහන් කර ඇති පරිදි විශේෂිත අවදානම් සමූහයකට යටත් වේ.

මූල්‍ය අවදානම

අකාර්යක්ෂම මුදල් ප්‍රවාහ කළමනාකරණය හා මූල්‍ය තොරතුරු සම්බන්ධ අවදානම් මගින් ආයතනවල ඵලදායීතාවයට හානි ගෙන දිය හැකි ය. ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ආයතනය පුරා පිරිවැය පාලන උපාය මාර්ග සම්බන්ධීකරණය කිරීම වැනි මූල්‍ය අවදානම් කළමනාකරණ පිළිවෙත් භාවිත කරයි.

මෙහෙයුම් අවදානම

පද්ධති යන හිටීම, පුද්ගලයන් අතින් සිදු විය හැකි දෝෂ, සාපරාධී ක්‍රියාකාරකම් හෝ අභ්‍යන්තර පද්ධතිමය බිඳවැටීම් හේතුවෙන් සිදුවිය හැකි පාඩු මෙහෙයුම් අවදානම් වලට අයත් වේ. එවැනි තත්ත්වයන් මගින් සිදු විය හැකි පාරිභෝගික විශ්වාසයට හා ආයතනික ප්‍රතිරූපයට හානි සිදුවිය හැකිය. මෙහෙයුම් අවදානම අවම කිරීම පිණිස ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය නිරතුරුවම අභ්‍යන්තර පාලනයන් වැඩිදියුණු කරයි. ආයතනික අවදානම මගින් ඇතිවන තර්ජනය අවම කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් මෙහෙයුම් ඒකක සහ ව්‍යාපාර ක්‍රියාවලිය පිළිබඳ නිරන්තර අවදානම් තක්සේරු කිරීම සිදුකරනු ලබයි.

නීතිය අවදානම

ආයතනයට එරෙහිව ගනු ලැබිය හැකි අනාගතමය නීතිමය ක්‍රියාමාර්ගවලින් ආරක්ෂා වීමට අපොහොසත් වීම නීතිමය හානි සිදුවීමේ අවදානම වැඩිකරයි. ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය පිළිගත් නීති වෘත්තිකයින්ගේ උපදෙස් ලබා ගෙන එවැනි ක්‍රියාමාර්ග අවම කිරීම සඳහා සුදුසු පියවර ගෙන තිබේ.

තොරතුරු තාක්ෂණ අවදානම

තොරතුරු තාක්ෂණ පද්ධතිය මගින් ලබා ගන්නා නිශ්චිත හා කාලෝචිත තොරතුරු ශ්‍රී ලංකා තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනයෙහි මෙහෙයුම් ක්‍රියාවලියේ මූලික ම අංගයක් වේ. ආයතනය ස්වකීය තොරතුරු තාක්ෂණ පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් දියත් කර ඇත.

විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන අපගේ වාර්තාව අපි සතුටින් ඉදිරිපත් කරන්නෙමු.

විගණන කමිටුවේ සංයුතිය

විගණන කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනා (03) ගෙන් සමන්විත වේ.

1. එච්.එම්.එස්.ධර්මවර්ධන මයා - සභාපති (අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ව්‍යාපාර දෙපාර්තමේන්තුව)
2. ඩබ්ලිව්.ඒ.කුලසූරිය මයා - සාමාජික (අතිරේක ලේකම්, පාලන, ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන අංශය)
3. වෛද්‍ය ලාල් ඒකනායක මයා සාමාජික (අධ්‍යක්ෂ ජනරාල්, ජා.ක්‍රි.වෛද්‍යායතනය)

අධ්‍යක්ෂ ජනරාල්, ගණකාධිකාරී, පරිපාලන නිලධාරී සහ අනෙකුත් අදාළ නිලධාරීන් මෙම රැස්වීම්වලට සහභාගී වීම අනිවාර්ය වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරී සහ ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන අංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක මෙම කමිටුවේ නිරීක්ෂකයෙකු ලෙස රැස්වීම්වලට සහභාගී වේ.

විගණන කමිටුවේ කාර්යභාර්ය

පිරිසිදු ක්‍රීඩාවක් ස්ථාපිත කිරීම හා ආයතනය සතු වත්කම් ආරක්ෂා කරගැනීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වාගත යුතු ය. මුදල් අමාත්‍යාංශය සහ අදාළ බලධාරීන් විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ ද කමිටුව විසින් අනුගමනය කරනු ලබයි. 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ දී විගණන කමිටුව විසින් එහි ප්‍රධාන වගකීම්වලට අදාලව සිදුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.

1.අනුමත වාර්ෂික විගණන සැළැස්මට අනුකූල ව වරින්වර සිදුකරන ලද අභ්‍යන්තර විගණන පිළිබඳ කාලීන විගණන වාර්තා අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරනු ලැබේ. මෙම අභ්‍යන්තර විගණන වාර්තා මගින් ආයතනයේ ක්‍රියාත්මක ව පවතින පද්ධති හා ක්‍රියාපටිපාටිවල ඇති අඩුපාඩු අවධාරණය කර පෙන්වා දෙන අතර, නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමෙන් අනතුරු ව අවශ්‍ය අවස්ථාවන් හි පවතින ක්‍රමවේද හා කාර්ය පටිපාටිවල වැඩිදියුණු කිරීම් නිර්දේශ කර, කළමනාකරණ හා විගණන කමිටුවට ප්‍රගතිය වාර්තා කරයි.
විගණන කමිටුවට අභ්‍යන්තර විගණනයෙන් නිසිපතා වාර්තා ලැබෙන අතර, එම කාලපරිච්ඡේදය තුළ සිදු කරන ලද එක එක් විගණනය මගින් සොයා ගත් කරුණු පිළිබඳ සාරාංශයක් එම වාර්තාවලට ඇතුළත් වේ. කළමනාකරණයෙහි අදහස් ද එහි කොටසක් වන අතර, විගණනය විසින් නිරීක්ෂණය කර ඇති තත්වයන්ට හේතු වී ඇති මූලික කරුණු සහ එම තත්වයන්ට හේතු වී ඇති කරුණු සහ එම තත්වයන් නැවත ඇතිවීම වළක්වා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ද කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි.

2.අභ්‍යන්තර විගණනයේ හා රජයේ විගණනයේ සහය ඇති ව කමිටුව විසින් ආයතනයේ මෙහෙයුම් සහ මූල්‍ය පාලන සහ කාර්යපටිපාටිවල ඵලදායීතාවය තක්සේරු කරනු ලබන අතර, ඒවාට වියදම්, ආදායම් ක්‍රියාවලිය සහ ප්‍රාග්ධන වියදම් සඳහා අවසර දීමේ සීමා, අත්සන් කිරීමේ බලධාරීන්, තොරතුරු තාක්ෂණික යෙදවුම් පාලන හා සංවර්ධනය කිරීම, ආයතනික ව්‍යූහය, ප්‍රතිපත්ති, රාජකාරී වෙන් කර දීම සහ කළමනාකරණය විසින් සිදු කරනු ලබන සමාලෝචන ඇතුළත් වේ. ආයතනයෙහි මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ද්‍රවශීලතා තත්වය නිරන්තරයෙන් නිරීක්ෂණය කරන ලදි. එහි දී හඳුනා ගනු ලබන අඩු පාඩු අවශ්‍ය වැඩිදියුණු කිරීම් සඳහා වන නිර්දේශ ද සහිතව වාර්තා කරනු ලැබේ.
පවත්වන ලද විගණන කමිටු රැස්වීම් ගණන

2023 වර්ෂය සඳහා රැස්වීම් හතරක් (04) පවත්වන ලද අතර ඒ සඳහා පැමිණීම පහත පරිදි වේ.

විගණන කමිටුව	පැමිණීම	නොපැමිණීම
එච්.එම්.එස්.ධර්මවර්ධන මයා	3/4	4/1
ඩබ්ලිව්.ඒ.කුලසූරිය මයා	4/4	නැත
වෛද්‍ය ලාල් ඒකනායක මයා	4/4	නැත
බී. එල්.ඩී. බාලසූරිය මිය	4/2	* 4/2
ඩී.එච්.කලංසූරිය මිය	4/4	නැත
*පී.ජී.ඩී.යූ. රත්නසේකර මිය (බී. එල්.ඩී. බාලසූරිය මිය වෙනුවට)	4/2	-

එච්.එම්.එස්.ධර්මවර්ධන
සභාපති
විගණන හා කළමනාකරණ කමිටුව

මූල්‍ය වාර්තා

- විස්තීරණ ආදායම් ප්‍රකාශය
- මූල්‍ය තත්ව ප්‍රකාශය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය
- හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය
- ගිණුම්කරණ ප්‍රතිපත්ති
- අවසාන ගිණුම් සඳහා සටහන්
- ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව
- කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග





ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
මූල්‍ය තත්ව ප්‍රකාශය

	සටහන	2023 දෙසැම්බර් 31	2022 දෙසැම්බර් 31 (ශ්‍රී ලංකා රුපියල්)
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත සහ උපකරණ	1	228,251,532.25	260,487,075.24
		228,251,532.25	**260,487,075.24**
ජංගම වත්කම්			
තොගය	2	933,947.00	1,606,462.00
අයවිය යුතු දෑ	3	603,000.00	1,739,028.00
කලින් ගෙවූ වියදම්/ අත්තිකාරම් ගෙවීම්	4	1,677,665.12	236,249.79
මුදල් හා මුදල් හා සමාන දෑ	5	1,773,913.40	1,663,842.06
		4,988,525.52	**5,245,581.85**
මුළු වත්කම්		**233,240,057.77**	**265,732,657.09**
අරමුදල් හා වගකීම්			
මූල්‍යනය කළේ:			
භාණ්ඩාගාර ප්‍රතිපාදන	6	188,029,846.83	217,689,516.41
අමාත්‍යාංශ ප්‍රතිපාදන	7	-	691,964.51
සමුච්චිත අරමුදල	8	13,801,400.64	8,633,057.43
ප්‍රත්‍යාගණන සංචිතය	9	23,502,228.35	23,502,228.35
		225,333,475.82	**250,516,766.70**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික වෙන් කිරීම්	10	2,161,920.00	2,581,369.53
ජංගම් වගකීම්			
ණයහිමියන් හා රඳවාගත් මුදල්	11	2,106,217.80	11,382,665.80
උපචිත වියදම්	12	3,598,444.15	1,211,855.06
ආපසු ගෙවියයුතු තැම්පතු	11	40,000.00	40,000.00
		5,744,661.95	**12,634,520.86**
		233,240,057.77	**265,732,657.09**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලද්දේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ රාජ්‍ය අංශයේ ගිණුම් කරන ප්‍රමිතීන්ට අනුකූලවය.

Damitha.

....

ඩී.බී ලියනගේ
ගණකාධිකාරී

....

වෛද්‍ය එස්.එස්.පී.ද අල්විස්
අධ්‍යක්ෂ ජනරාල්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් තබමි.

....

එම්.එන්.සුන්නා
අධ්‍යක්ෂ

....

මහාචාර්ය අර්ජුන ද සිල්වා
සභාපති

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ක්‍රියාකාරකම් ප්‍රකාශය

	සටහන	2023	2022
			(ශ්‍රී ලංකා රුපියල්)
භාණ්ඩාගාර ප්‍රතිපාදන	6	105,907,669.58	92,737,518.22
අමාත්‍යාංශ ප්‍රතිපාදන	7	691,964.51	753,122.50
වෙනත් ආදායම්	13	5,168,343.21	2,319,003.52
මුළු ආදායම්		111,767,977.30	95,809,647.61
පරිපාලන වියදම්	14	(106,599,634.09)	(93,490,644.09)
ශුද්ධ අතිරික්තය/(හිඟය)		**5,168,343.21**	**2,319,003.52**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා
මූදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන්	2023	2022
			(ශ්‍රී ලංකා රුපියල්)
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා මුදල් ප්‍රවාහයන්			
ශුද්ධ ලාභය		5,168,343.21	2,319,003.52
ගැලපීම්			
ක්ෂය		32,235,542.99	32,926,436.17
භාණ්ඩාගාර ප්‍රතිපාදන සඳහා වෙන් කිරීම්	6	(105,907,669.58)	(92,737,518.22)
		(68,503,783.38)	**(57,492,078.53)**
කාරක ප්‍රාග්ධන වෙනස් වීම්			
(වැඩි කිරීම්)/අඩු කිරීම් තොගය		672,515.00	399,118.20
(වැඩි කිරීම්)/අඩු කිරීම් අයවිය යුතු පරීක්ෂණ ගාස්තු		1,136,028.00	(442,928.00)
(වැඩි කිරීම්)/අඩු කිරීම් කලින් ගෙවූ වියදම්		(1,441,415.33)	147,974.24
වැඩි කිරීම්/ (අඩු කිරීම්) පාරිතෝෂික වෙන් කිරීම්	10	(419,449.53)	164,012.03
වැඩි කිරීම්/(අඩු කිරීම්) ගෙවිය යුතු දෑ හා රැඳවුම් මුදල්		(9,276,448.00)	(917,894.14)
වැඩි කිරීම්/(අඩු කිරීම්) උපචිත වියදම්		2,386,589.09	(16,181.03)
		(6,942,180.77)	**(665,898.70)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා ශුද්ධ මුදල්		**(75,445,964.15)**	**(58,157,977.23)**
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් ප්‍රවාහ			
දේපල පිරියත උපකරණ මිලදී ගැනීම්		-	(62,003,235.80)
කාරක ප්‍රාග්ධන ප්‍රගතිය		-	60,211,400.00
		-	**(1,791,835.80)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ			
භාණ්ඩාගාර ප්‍රතිපාදන		76,248,000.00	58,616,000.00
ලේකම් - ක්‍රීඩා අමාත්‍යාංශය		(691,964.51)	(753,125.87)
		75,556,035.49	**57,862,874.13**
වර්ෂය තුළ දී මෙහෙයුම් තුළින් ජනිත වූ ශුද්ධ ලාභය (ප්‍රයෝජනයට ගන්නා ලද)		**110,071.34**	**(2,086,938.90)**
වර්ෂ ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ		**1,663,842.06**	**3,750,780.96**
වර්ෂ අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ		**1,773,913.40**	**1,663,842.06**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය
2023 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

(ශ්‍රී ලංකා රුපියල්)

	භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.	අමාත්‍යාංශ ප්‍රතිපාදන රු.	ප්‍රත්‍යාගණන සංචිතය රු.	සමුච්චිත ලාභය රු.	මුළු අගය රු.
2020.01.01 දිනට ශේෂය	**266,081,050.16**	**2,951,335.38**	**-**	**1,537,638.00**	**270,570,023.54**
වසර තුළ අතිරේක	71,711,000.00	-	-	-	71,711,000.00
අරමුදල් ක්‍රමක්ෂය හා භාණ්ඩාගාර පියවීම්	(71,562,628.27)	(753,122.50)	-	-	(72,315,750.77)
වර්ෂයේ ශුද්ධ ලාභය	-	-	-	2,927,395.91	2,927,395.91
ප්‍රත්‍යාගණන සංචිතය	-	-	2,547,085.96	-	2,547,085.96
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය-සංශෝධිත	**266,229,421.89**	**2,198,212.88**	**2,547,085.96**	**4,465,033.91**	**275,439,754.64**
වසර තුළ අතිරේක	50,056,000.00	-	-	-	50,056,000.00
අරමුදල් ක්‍රමක්ෂය	(64,474,387.26)	(753,122.50)	-	-	(65,227,509.76)
වර්ෂයේ ශුද්ධ ලාභය	-	-	-	1,849,020.00	1,849,020.00
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**251,811,034.63**	**1,445,090.38**	**2,547,085.96**	**6,314,053.91**	**262,117,264.88**
වසර තුළ අතිරේක	58,616,000.00	-	-	-	58,616,000.00
අරමුදල් ක්‍රමක්ෂය	(92,737,518.22)	(753,125.87)	-	-	(93,490,644.09)
වර්ෂයේ ශුද්ධ ලාභය	-	-	-	2,319,003.52	2,319,003.52
ප්‍රත්‍යාගණන සංචිතය	-	-	20,955,142.39	-	20,955,142.39
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**217,689,516.41**	**691,964.51**	**23,502,228.35**	**8,633,057.43**	**250,516,766.70**
වසර තුළ අතිරේක	76,248,000.00	-	-	-	**76,248,000.00**
අරමුදල් ක්‍රමක්ෂය	(105,907,669.58)	(691,964.51)	-	-	**(106,599,634.09)**
වර්ෂයේ ශුද්ධ ලාභය	-	-	-	5,168,343.21	**5,168,343.21**
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**188,029,846.83**	**-**	**23,502,228.35**	**13,801,400.64**	**225,333,475.82**

1. වාර්තා කිරීමේ ආස්ථිත්‍යය

1.1 පොදු

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය 2013 නොවැම්බර් මස 11වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ දී සම්මත කරන ලද 2013 අංක 33 දරන උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතට අනුව ස්ථාපිත කරන ලදී. මෙම ආයතනයේ ලියාපදිංචි කාර්යාලය අංක 363/12, සුගතදාස ස්මේඩියම් - බ්ලොක් ඩී, ස්ටේඩියම් රථගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14 යන ලිපිනයේ පිහිටුවා ඇත.

1.1 .1 ආයතනයේ අරමුණු

a) ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීම පිටුදැකීම සඳහා අවශ්‍ය වන යම් පියවර ගැනීම.
b) ක්‍රීඩාවලට සම්බන්ධ උත්තේජක ගැනීම සම්බන්ධ ක්ෂේත්‍ර හා අදාළ පර්යේෂණ සහ නියෝජ්‍යායතනය සහ සමාන කර්තව්‍ය ඉටු කරනු ලබන වෙනත් අන්තර්ජාතික සංවිධාන අතර අන්‍යොන්‍ය පරීක්ෂණ ප්‍රවර්ධනය කිරීම.

1.1.2. ප්‍රකාශන අනුකූලතාවය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනයේ ගිණුම් සකස් කරනු ලබන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව ය.

1.1.3. සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ ඓතිහාසික පිරවැය පදනම යටතේ ය. මෙහිදී උද්ධමනීය සාධක සැලකිල්ලට ගනු නොලබයි.

1.1.4. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්.

ශේෂපත්‍ර දිනට පසු ව වියහැකි ප්‍රධාන ප්‍රතිවිපාක සඳහා අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල හා ගිණුම් වල අනාවරණය කරනු ලබයි.

1.2. වත්කම් සහ අගය කිරීමේ පදනම

වර්ෂයක් තුළ මුදල් සහ බැංකු ශේෂය සහ මුදල් වලට පරිවර්තනය කළ හැකි අයිතම සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළ ජංගම වත්කම් ලෙස හඳුනාගෙන ශේෂ පත්‍රයේ විස්තර කර ඇත.

1.2.1 වත්කම්

දේපල පිරියත සහ උපකරණවල අගය දක්වා ඇත්තේ සමුච්චිත ක්ෂය අඩු කිරීමෙන් පසුව ය.

1.2.2 ක්ෂය

ක්ෂය ප්‍රතිපත්තිය සිදු කර ඇත්තේ සරළ මාර්ග ක්‍රමයට ය. ක්ෂය කරනු ලබන්නේ වත්කම් අත්පත් කරගත් වර්ෂයේ සිට හෝ අදාළ වත්කමේ ඉදිකිරීම් කටයුතු අවසන් වූ වර්ෂයේ සිට ය. වත්කමේ අපේක්ෂිත ඵලදායී ජීවකාලය තුළ ආදායම් සහ වියදම් ගිණුමෙන් ක්ෂය කපා හැරීම.

- පරිගණක සහ උපකරණ 25%
- ගෘහ උපකරණ 10%
- වෙනත් උපකරණ 25%
- මෝටර් වාහන 12.5%
- පර්යේෂණ උපකරණ 25%
- රසායනාගාර ගෘහ උපකරණ 10%
- ගොඩනැගිලි 5%

1.2.3 ප්‍රත්‍යාගණනය

සුදුසුකම් සහිත පුද්ගලයින් විසින් පරිසණක සහ උපකරණ,වෙනත් උපකරණ හා පර්යේෂණ උපකරණ සඳහා ප්‍රත්‍යාගණනය සිදුකරනු ලබයි. ප්‍රත්‍යාගණන අතිරික්තය වත්කමෙහි දළ ධාරණ අගය මත හඳුනාගෙන එහි ප්‍රත්‍යාගණන වටිනාකම ප්‍රත්‍යාගණන සංචිතයකට මාරු කරනු ලබයි

1.2.4 තොග

වසර අවසාන තොගය ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. 9, ඡේද 16 ට අනුකූලව තක්සේරු කර ඇති අතර, හුවමාරු නොවන ගනුදෙනුවක් මාර්ගයෙන් තොග අත්පත් කරගත් අවස්තාවල දී ඒවායේ පිරිවැය ඒවා අත්පත් කරගත් දින පැවති සාධාරණ අගයට මනිනු ලැබේ. තොගවල සාධාරණ අගය/ ගැනුම් පිරිවැය (අ) ගැනුම් මිල, (ආ) ආනයන තීරු බදු සහ අනෙකුත් බදු සහ (ඇ) ප්‍රවාහන වියදම් හා පරිහරණ ගාස්තු සහ නිමි භාණ්ඩ අත්පත් කර ගැනීම සඳහා සෘජුවම අදාළ වන අනෙකුත් පිරිවැයවලින් සමන්විතවේ. ආයතනයේ තොග පහත පරිදි වේ.

- මානව සම්පල් කට්ටල
- ලිපිද්‍රව්‍ය
- ටෝනර් සහ කාට්රිජ්

1.3. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී හඳුනාගත් සියලු ම වගකීම් ගිණුම්ගත කර ඇත.ශේෂපත්‍ර දින සිට වර්ෂයක් තුළ ගෙවිය හැකි හෝ ඉල්ලීමක් මත ගෙවිය හැකි වගකීම් ජංගම වගකීම් ලෙස ශේෂ පත්‍රයේ හඳුනාගෙන ඇත.ගෙවීම සඳහා වර්ෂයකට වැඩි කාලයක් ගත වන වගකීම් ජංගම නොවන වගකීම් වේ.

1.3.1 සේවකයන්ගේ හිමිකම්.

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා දායකත්වය මූල්‍ය ප්‍රකාශනයේ වියදම් ලෙස හඳුනාගෙන ඇත.

1.3.2. සේවකයන් සඳහා විශ්‍රාම පාරිතෝෂික

සෑම සේවකයෙකු සේවයෙහි යෙදී පළමු වර්ෂය අවසන් වූ පසු ව විශ්‍රාම පාරිතෝෂික වෙන් කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව මෙය සිදුකරනු ලබයි.

සෑම වර්ෂයක ම දෙසැම්බර් මස අවසාන දිනට ඇති කාර්යය මණ්ඩලයේ දළ වැටුපෙන් භාගයක් පාරිතෝෂික සඳහා වෙන් කරනු ලබයි. කෙසේ වෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව මෙම ගෙවීම සිදු කරනු ලබන්නේ වසර 5ක අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කරන ලද සේවකයින්ට පමණි.

1.4. ආදායම් ප්‍රකාශය

1.4.1 ආදායම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලවය අදාළ සේවාව ලබා දීමෙන් පසුව උපචිත පදනම මත ආදායම හඳුනාගනී.

1.4.2 වියදම්

වියදම් පිළිබඳ විස්තරයෙහි ලාභය හෝ අලාභය හඳුනාගන්නේ බදු අයකිරීමට පෙර හා හඳුනාගත් සියලු වගකීම් සඳහා වෙන්කිරීමෙන් පසුව ය.

වත්කම් නඩත්තු කිරීමේ හා ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ දී දැරීමට වන වියදම් ශුද්ධ ඌනතාවය හෝ අතිරික්තය ගණනය කිරීමේ දී ආදායම් පිළිබඳ විස්තර වල ගලපනු ඇත. දූරකථන වියදම්, විදුලි වියදම් හා ජල බිල්පත් එම පහසුකම් සඳහා හිමිකම් කියන නිලධාරීන් හා සේවකයවන්ගෙන් අයකරනු ලබයි. එම වියදම් අදාළ තීරු හි විස්තර කරනු ලබයි.

1.4.3 ප්‍රතිපාදන

ප්‍රතිපාදන හා ආධාර අදාළ වියදම් සඳහා ගැළපෙන අයුරින් සකස් කර ඇත. වත්කම් හා සම්බන්ධ මූල්‍ය නොවන ප්‍රතිපාදන, මූල්‍ය වටිනාකම මත ගිණුම්ගත කළ යුතු අතර එම වත්කම් ආදායම් ප්‍රකාශයේ වත්කමේ ඵලදායි ජීව කාලය තුළ කපා හරිනු ඇත.

1.4.4 අනෙකුත් ප්‍රතිපාදන

අනෙකුත් ප්‍රතිපාදන සහ ආධාර විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වියදම් ලෙස ගිණුම්ගත කළ යුතු අතර, වැඩසටහන අවසානයේ ඇති යම් මුදලක් තිබේ නම්, එය වෙනත් ආදායමක් ලෙස ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

1.5. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.5.1 මුදල්

අතැති මුදල් හා ඉහළ ද්‍රවශීලතාවක් සහිත කිසිදු අවදානමකින් තොර ව පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළ හැකි වත්කම් මුදල් ලෙස හඳුනා ගනී. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අවශ්‍යතාවය මත අතැති මුදල් හා බැංකු මුදල්, මුදල් ලෙස හඳුනා ගැනේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනුයේ වක්‍ර පදනමටය.

1.5.2 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්.

ශේෂපත්‍ර දිනට පසු ව විය හැකි ප්‍රධාන ප්‍රතිවිපාක සඳහා අවශ්‍ය ගැළපීම් මූල්‍ය ප්‍රකාශන වල හා ගිණුම්වල අනාවරණය කරනු ලබයි.

සටහන 01
දේපළ පිරියත සහ උපකරණ
(ශ්‍රී ලංකා රුපියල්)

පිරිවැය/ ප්‍රත්‍යාගණිත	**2023.01.01** දිනට ශේෂය	ප්‍රවර්ථන වර්ෂයේ එකතු කිරීම්	**2023.12.31** දිනට ශේෂය
ගොඩනැගිලි සහ සැලසුම්	217,189,969.57	-	217,189,969.57
ගෘහ භාණ්ඩ	873,436.35	-	873,436.35
පරිගණක සහ උපකරණ	3,105,934.27	-	3,105,934.27
වෙනත් උපකරණ	2,416,000.00	-	2,416,000.00
රථ වාහන -WPLW - 0353	6,024,980.00	-	6,024,980.00
පර්යේෂණ උපකරණ	69,869,800.00	-	69,869,800.00
රසායනාගාර ගෘහ උපකරණ	16,876,414.30	-	16,876,414.30
	316,356,534.49	**-**	**316,356,534.49**

සමුච්චිත ක්ෂය	**2023.01.01** දිනට ශේෂය	ප්‍රවර්ථන වර්ෂයේ එකතු කිරීම්	**2023.12.31** දිනට ශේෂය
ගොඩනැගිලි සහ සැලසුම්	43,189,844.24	10,859,498.48	54,049,342.72
ගෘහ භාණ්ඩ	693,416.65	87,343.64	780,760.29
පරිගණක සහ උපකරණ	1,461,428.57	776,483.57	2,237,912.14
වෙනත් උපකරණ	1,191,662.50	604,000.00	1,795,662.50
රථ වාහන -WPLW - 0353	4,270,183.00	753,125.87	5,023,308.87
පර්යේෂණ උපකරණ	-	17,467,450.00	17,467,450.00
රසායනාගාර ගෘහ උපකරණ	5,062,924.29	1,687,641.43	6,750,565.72
	55,869,459.25	**32,235,542.99**	**88,105,002.24**
2023.12.31 දිනට ලේඛනගත අගය	**260,487,075.24**	**(32,235,542.99)**	**228,251,532.25**

(ශ්‍රී ලංකා රුපියල්)

	2023	2022
සටහන-02		
තොග		
අවසන් තොගය - මානව සම්පල් කට්ටල	232,000.00	815,540.00
අවසන් තොගය - ලිපිද්‍රව්‍ය	299,130.00	578,615.00
අවසන් තොගය - ටෝනර් සහ කාට්රිජ්	402,817.00	212,307.00
	933,947.00	**1,606,462.00**
සටහන-03		
අයවියයුතු දෑ		
පරීක්ෂණ ආදායම් - ශ්‍රී ලංකා ක්‍රිකට් මණ්ඩලය	-	870,000.00
පරීක්ෂණ ආදායම් - රෝයල් ටර්ෆ් ක්ලබ්	-	714,100.00
පරීක්ෂණ ආදායම් - ජාත්‍යන්තර පැරාලිම්පික්	-	154,928.00
ලැබිය යුතු මුදල් - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	603,000.00	-
	603,000.00	**1,739,028.00**
සටහන-04		
කලින් ගෙවූ වියදම්		
ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් (පුද්) සමාගම	11,965.75	6,486.26
මෙට්‍රොපොලිටන් ඔෆිස් (පුද්) සමාගම	3,354.17	2,880.00
ඔෆිස්ට්‍රොනික්ස් (පුද්) සමාගම	15,416.67	12,083.33
හේලීස් ඇවෙන්චුරා (පුද්) සමාගම	24,332.08	-
ඔෆිස් නෙට්වර්ක් (පුද්) සමාගම	415.89	-
සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සේවා	-	75,603.60
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව	-	139,196.60
අත්තිකාරම් ගෙවීම - Lockcon AG	1,622,180.56	-
	1,677,665.12	**236,249.79**
සටහන-05		
මුදල් සහ මුදල් හා සමාන දෑ		
ලංකා බැංකුව - ගිණුම් අංක 75463697	1,773,913.40	1,663,842.06
	1,773,913.40	**1,663,842.06**
සටහන-06		
භාණ්ඩාගාර ප්‍රතිපාදන		
ආරම්භක වර්ෂයේ ශේෂය	217,689,516.41	251,811,034.63
ගලා ඒම් -2023	76,248,000.00	58,616,000.00
	293,937,516.41	310,427,034.63
අරමුදල් ක්‍රමක්ෂය 2023	(105,907,669.58)	(92,737,518.22)
වර්ෂ අවසානයේ ශේෂය	**188,029,846.83**	**217,689,516.41**
සටහන-07		
අමාත්‍යාංශ ප්‍රතිපාදන		
ආරම්භක වර්ෂයේ ශේෂය	691,964.51	1,445,090.38
අරමුදල් ක්‍රමක්ෂය 2023	(691,964.51)	(753,125.87)
වර්ෂ අවසානයේ ශේෂය	**-**	**691,964.51**

	2023	2022
සටහන-08		
සමුච්චිත අරමුදල		
ආරම්භක වර්ෂයේ ශේෂය	8,633,057.43	6,314,053.91
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා ලාභය මාරු කිරීම	5,168,343.21	2,319,003.52
වර්ෂ අවසානයේ ශේෂය	**13,801,400.64**	**8,633,057.43**
සටහන- 09		
ප්‍රත්‍යාගණන සංචිත		
ආරම්භක වර්ෂයේ ශේෂය	23,502,228.35	2,547,085.96
ප්‍රත්‍යාගණන අතිරික්තය	-	20,955,142.39
වර්ෂ අවසානයේ ශේෂය	23,502,228.35	**23,502,228.35**
සටහන-10		
පාරිතෝෂික වෙන් කිරීම්		
වර්ෂය ආරම්භයේ වෙන් කිරීම	2,581,369.53	2,417,357.50
වසර සඳහා පාරිතෝෂික ගෙවීම	(685,155.00)	(299,675.00)
වර්ෂයේ වෙන් කිරීම	265,705.47	463,687.03
වර්ෂ අවසානයේ වෙන් කිරීම	**2,161,920.00**	**2,581,369.53**
සටහන-11		
ණයහිමි හා රැඳවුම් ගිණුම්		
ඇනලටිකල් ඉන්ස්ටෘමන්ට්ස්	472,915.80	472,915.80
හේලීස් ලයින් සයන්ස් (පුද්) සමාගම	-	3,278,500.00
Anti-Doping Lab Qatar	1,633,302.00	7,631,250.00
	2,106,217.80	**11,382,665.80**
සටහන-12		
උපචිත වියදම්		
ආරම්භක වර්ෂයේ ශේෂය	140,000.00	-
තැපල් සහ සන්නිවේදන	31,130.09	29,448.06
විදුලිය සහ ජල වියදම්	466,915.46	179,623.56
මෙහෙයුම් කල්බදු - ලීසිං කුලිය	238,000.00	-
වැටුප් හා වේතන	17,225.00	16,000.00
අතිකාල දීමනා වියදම්	55,173.92	57,757.62
ප්‍රවාහන වියදම්	124,000.00	90,000.00
ආරක්ෂක සේවා	318,107.69	266,328.20
පවිත්‍රතා සහ සනීපාරක්ෂක සේවා	162,800.00	178,000.00
විගණන ගාස්තු	170,000.00	263,600.00
තහනම් උත්තේජක පරීක්ෂණ වියදම්	1,443,459.60	119,547.62
වාහන නඩත්තු වියදම්	197,350.00	-
යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම්	79,453.95	-
ප්‍රකාශනය සහ ප්‍රවර්ධනය	2,620.00	11,550.00
අනෙකුත් වියදම්	4,145.00	-
පර්යේෂණ සහ සංවර්ධන	122,337.18	-
ගෙවිය යුතු උ.වි.ගෙ.බදු	25,726.26	-
	3,598,444.15	**1,211,855.06**

සටහන-13	2023	2022
වෙනත් ආදායම්		
උත්තේජක පරීක්ෂණ ආදායම්	2,939,478.10	1,603,417.00
යළි නොගෙවන තැම්පතු	15,000.00	8,000.00
කුලී ආදායම්	72,000.00	78,750.00
වෙනත් ආදායම්	837,862.00	628,836.52
විදේශ විනිමය ලාභ	1,304,003.11	-
	5,168,343.21	**2,319,003.52**

සටහන-14		
පරිපාලන වියදම්		
වැටුප් හා වේතන	13,279,616.26	13,813,220.19
අතිකාල සහ නිවාඩු දින ගෙවීම්	485,367.83	558,481.76
සේවක අර්ථසාධක අරමුදල	1,214,671.05	1,384,496.03
සේවක නියුක්තිකයේ භාරකාර අරමුදල	303,667.76	346,124.01
ගෘහස්ථ, ප්‍රවාහන සහ ඉන්ධන දීමනා	305,582.66	600,000.00
විදේශීය ගමන් වියදම්	1,534,535.68	454,948.80
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල උපකරණ	883,017.56	250,089.62
ඉන්ධන	1,900,389.30	2,280,751.50
වාහන නඩත්තු වියදම්	624,110.60	110,724.02
ගොඩනැගිලි සහ සැලසුම් නඩත්තු වියදම්	224,945.70	157,960.00
යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම්	1,648,614.87	2,006,604.43
ප්‍රවාහන	1,246,090.00	1,129,937.00
මෙහෙයුම් කල්බදු සඳහා ගෙවීම්	2,552,309.50	2,401,000.00
තැපැල් සහ සන්නිවේදන	551,553.65	446,863.28
විදුලිය සහ ජලය	5,033,205.53	2,806,659.86
තහනම් උත්තේජක පරීක්ෂණ ගාස්තු	11,160,508.23	15,958,669.85
ප්‍රචාරණය සහ ප්‍රවර්ධනය	1,368,384.00	905,280.00
පුහුණු සහ රැස්වීම් වියදම්	1,202,412.00	877,883.09
සාමාජිකත්වය අළුත් කර ගැනීමේ වියදම්	5,965,930.23	5,625,034.46
විගණන ගාස්තු	170,000.00	384,200.00
අලෙවිකරණ සහ පර්යේෂණ වියදම්	-	116,380.27
දැනුවත් කිරීමේ වැඩමුළු	-	5,400.00
ධාරිතාව වර්ධන	1,027,242.00	352,309.00
ක්ෂය වීම්	32,235,542.99	32,926,436.17
පාරිතෝෂික වියදම්	265,705.47	463,687.03
පවිත්‍රතා සහ සනීපාරක්ෂක සේවා	2,015,700.00	2,016,937.50
ආරක්ෂක සේවා	3,586,346.75	2,613,567.90
අනෙකුත් වියදම්	167,830.90	80,744.44
තහනම් උත්තේජක සම්බන්ධ අධ්‍යාපනය	489,915.46	325,887.75
තහනම් උත්තේජක- බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම	913,588.00	537,557.00
පර්යේෂණ හා සංවර්ධන	2,580,291.31	283,119.23
නීතිමය සහ බලාත්මක කිරීමේ වියදම්	274,276.87	557,872.00
පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ වියදම්- යන්ත්‍රෝපකරණ	260,929.25	683,317.90
පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ වියදම්- වාහන	445,500.00	28,500.00
18 වැනි ආසියානු/ ශාන්තිකර කලාපීය අමාත්‍ය මණ්ඩල සමුළුව	10,681,852.68	-
	106,599,634.09	**93,490,644.09**

මගේ අංකය எனது இல. My No. SYA/C/SLADA/01/23/02 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2024 ජූනි 10 දින

සභාපති
ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ("නියෝජ්‍යායතනය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනත සහ 2013 අංක 33 දරණ ක්‍රීඩාවල යෙදීමෙදි උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 30 වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන තුළින් නියෝජ්‍යායතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 නියෝජ්‍යායතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් නියෝජ්‍යායතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

නියෝජ්‍යායතනයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, නියෝජ්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය නියෝජ්‍යායතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැනි විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

නියෝජ්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, නියෝජ්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සම්ස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා නියෝජ්‍යායතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට නියෝජ්‍යායතනයට සම්බන්ධව් යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නියෝජ්‍යායතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය නියෝජ්‍යායතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රයම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සතුව රු.86,746,214 ක් වටිනා නවීන තාක්ෂණික උපකරණ වලින් සමන්විත රසායනික පර්යේෂණාගාරය 2022 නොවැම්බර් 03 දින සිට භාවිතයට ගැනීමට සුදුසු තත්වයක පැවතුණ ද පර්යේෂණ කටයුතු ආරම්භ කර තිබුණේ 2023 අගෝස්තු මසදීය. තවද එම පරීක්ෂණාගාරයේ පර්යේෂණ කටයුතු සඳහා විශ්වවිද්‍යාල 02ක සිසුන් 06 දෙනෙකුට පමණක් අවස්ථාව ලබාදී තිබුණි. ඒ අනුව අවශ්‍යතාව පවතින ආයතන හදුනාගෙන පර්යේෂණාගාරය ස්ථාපිත කිරීමේ අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බැංකු ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ සෑම දිනකම අවසානයේදී බැංකු ජංගම ගිණුමක අවම වශයෙන් රු.මිලියන 02 ක මුදලක් නිෂ්ක්‍රියව තබාගැනීම හේතුවෙන් නියෝජ්‍යායතනයට රු.766,378 ක මුල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි.

ඩබ්ලිව්.පී.ඒ. වික්‍රමරත්න
විගණකාධිපති

කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ ව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති විසින් ඉදිරිපත් කරනු ලැබූ වාර්තාවේ කරුණුවලට ආයතනයේ කළමනාකරීත්වයේ යෝජිත පියවරයන් පහත පරිදි වේ.

1. **කරුණ :-**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය සතුව රු.86,746,214ක් වටිනා නවීන තාක්ෂණික උපකරණ සහිත රසායනික පර්යේෂණාගාරය 2022 නොවැම්බර් 03 දින සිට භාවිතයට ගැනීමට සුදුසු තත්වයක පැවතුණ ද පර්යේෂණ කටයුතු ආරම්භ කර තිබුණේ 2023 අගෝස්තු මස දී ය. තවද එම පර්යේෂණාගාරයේ පර්යේෂණ කටයුතු සඳහා විශ්ව විද්‍යාල 02ක සිසුන් 06 දෙනෙකුට පමණක් අවස්ථාව ලබා දී තිබුණි ඒ අනුව අවශ්‍යතාව පවතින ආයතන හඳුනාගෙන පර්යේෂණාගාරය ස්ථාපිත කිරීමේ අරමුණු ළඟාකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

කළමනාකරීත්වයේ අදහස්

පර්යේෂණාගාරයේ පවතින රසායන ද්‍රව්‍ය සැපයුම LC-MS/MS උපකරණයේ විශ්ලේෂණ කාලය හා එම උපකරණයේ නඩත්තු කටයුතු යන කරුණු පර්යේෂණාගාරයේ පර්යේෂණ ධාරිතාවයට සීමාකාරී සාධකය වේ. එමෙන්ම විවිධ පර්යේෂණවල අරමුණ හා විෂයපථයේ විශාලත්වය විවිධ බැවින් ස්ථිර පර්යේෂණ ගණනක් එක් වර්ෂයකට ඉදිරිපත් කිරීමට අපහසු වෙයි. එබැවින් මෙම පර්යේෂණාගාරය තුළ වසරකට විශ්ලේෂණ සිදුකළ හැකි ප්‍රමාණය පර්යේෂණ 4 ක් පමණ වෙයි.

LC-MS/MS උපකරණයේ පර්යේෂණ සඳහා අධික මිලක් දැරීමට සිදුවන බැවින් පෞද්ගලික විශ්ව විද්‍යාල වල සිසුන්ට පර්යේෂණ සඳහා සහභාගී වීමට අපහසුතා ඇත. තවද රජය විසින් නිකුත් කර ඇති මූල්‍ය ප්‍රතිපාදන එවැනි දීර්ඝ පර්යේෂණ සඳහා ප්‍රමාණවත් නොවේ.

2023 වර්ෂය පුරා පර්යේෂණ කටයුතු ආරම්භ කිරීම, විවිධ සහයෝගීතා ගොඩනගා ගැනීම, රසායන ද්‍රව්‍ය මිලදී ගැනීමට යෙදී සිටි අතර 2024 වර්ෂය තුළදී පර්යේෂණාගාරය භාවිතා කර ආදායම් ඉපැයීම සඳහා කටයුතු ආරම්භ කර ඇත.

2. **කරුණ :-**

බැංකු ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ සෑම දිනක ම අවසානයේ දී බැංකු ජංගම ගිණුමක අවම ශේෂයෙන් රු. මිලියන 02 ක මුදලක් නිෂ්ක්‍රියව තබා ගැනීම හේතුවෙන් නියෝජ්‍යායතනයට රු. 766,378 ක මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි.

කළමනාකරීත්වයේ අදහස්

අප ආයතනයේ පුනරාවර්තන වියදම් සඳහා රු.මි. 3කට අධික මුදලක් මාසික ව වැය වේ. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් සඳහා අක් මුදල් නිදහස් කිරීම බොහෝ විට අදාළ මස අවසානයේ හෝ ඊළඟ මාසයේ මුල නිකුත් කරන හෙයින් මාසයේ අවසානයේ සැලකිය යුතු මුදලක් ඉතිරිව පැවතුණි. එමෙන්ම එම ශේෂය තුළ අප ආයතනය විසින් උපයන ලද ආදායම් රු.මි.3.8 ක ප්‍රමාණයක්ද අන්තර්ගත විය. එබැවින් දෛනික අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් ශේෂයක් රඳවාගෙන ඉතිරි මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර පොලී අදායමක් ලබා ගැනීමට 2024 වර්ෂයේ සිට කටයුතු කර ඇත.